

IslamHouse.com

مركز أصول
OsoulCenter
www.osoulcenter.com

Rabwah

# ඉස්ලාමීය ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රධාන පාඩම්

කතෘ
අබ්දුල් අසීස් බින් මර්`සූක් අත් තරීෆී

සිංහල අනුවාදය
මුහම්මද් අකීල් මුහම්මද් අමීන්

විචාරය කිරීම
මුහම්මද් නලීම් ඉස්සදීන්

Sinhala
සිංහල
سنهالي

# فصول في العقيدة

## (الرسالة الشامية)

المؤلف

**عبد العزيز بن مرزوق الطريفي**

الترجمة

**محمد حقيل محمد أمين**

المراجعة

**محمد نظيم عز الدين**

සිංහල

sinhala

سنهالي

Osoul Center

*මෙම පොත උසූල් අන්තර්ජාතික මධ්‍යස්ථානය විසින් සංස්කරණය කොට ඇති අතර මෙහි භාවිතා කර ඇති සියලුම ඡායාරූපවලට හිමිකම් ලබනුයේ එම ආයතනයයි. පහත සඳහන් කොන්දේසි දෙක මත ඕනෑම අයුරින් මෙම පොත නැවත ප්‍රකාශයට පත් කිරීමට අවසර ඇත.1: මෙම මධ්‍යස්ථානයෙහි අවසරය හා පිළිගැනීම සියලු සංස්කරණ මත පැහැදිලිව සඳහන් විය යුතුයි. 2: මෙම මධ්‍යස්ථානය වෙත යොමු නොකොට කිසිදු වෙනසක් හෝ සංශෝධනයක් කිරීමට නොහැක. මෙම පොත නැවත මුද්‍රණය කිරීමේදී උසස් ප්‍රමිතිය පවත්වා ගැනීමට මධ්‍යස්ථානය දැඩි ලෙස නිර්දේශ කරයි.*

+966 50 444 2532

+966 11 445 4900

+966 11 497 0126

B.O.Box. 29465 - Riyadh 11457

osoul@rabwah.com

www.osoulcenter.com




අපරිමිත දයාන්විත අසමසම

කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙනි,

# පටුන

| | |
|---|---|
| පෙරවදන | 8 |
| පළවෙනි පාඩම | 13 |
| දෙවන පාඩම | 17 |
| තුන්වන පාඩම | 21 |
| සිව්වන පාඩම | 24 |
| පස්වන පාඩම | 29 |
| හයවන පාඩම | 33 |
| හත්වන පාඩම | 37 |
| අටවෙනි පාඩම | 41 |
| නමවන පාඩම | 45 |
| දහවන පාඩම | 49 |
| එකළොස්වන පාඩම | 53 |
| දොළොස්වන පාඩම | 55 |
| දහතුන්වන පාඩම | 59 |
| දාහතරවන පාඩම | 61 |
| පහළොස්වන පාඩම | 65 |
| දහසයවන පාඩම | 67 |

# පෙරවදන

පැසසුම් සියල්ල උත්තරීතර අල්ලාහ්ට හිමි වේවා ! නියත වශයෙන්ම අල්ලාහ්ට හිමි ගුණ වර්ණනාවන් අනන්තයි අප්‍රමාණයි. නැමදුමට සුදුස්සා ඔහු හැර අන් කිසිවෙකු නොමැති බව හා ඔහුට කොටස් කරුවෙකු හා ඔහුට සමාන කිසිවෙකු නොමැති බව මා සාක්ෂි දරමි. තවද මුහම්මද් (සල්) තුමාණන් අල්ලාහ්ගේ ගැත්තෙකු හා ඔහුගේ ධර්ම දූතයෙකු බව මා සාක්ෂි දරමි. (ඔහුට අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය උදා වේවා)

මෙය සිරියාවෙහි වාසය කරන ජනයා උදෙසා රචනා කළ සංෂිප්ත පොත් පිංචයකි. මිෂනරිවාදීන්ගේ සහ බාතිනියියාහ්වරුන්ගේ (ෂියාවරුන්ගෙන් ඉතා දරුණු නිකායකි) ආක්‍රමණයෙන් සියවසකට පමණ පසු සිරියාවට නිදහස ලැබුණි.මෙම ආක්‍රමණයෙන් පසු රට තුළ කලහකාරී තත්ත්වයක් සහ ඉස්ලාම් දහමෙහි මූලික හා එහි ශාඛා ඉගැන්වීම් රාශියක ව්‍යාකූලත්වයක් ව්‍යාප්ත වී තිබුණි. එබැවින් අල්ලාහ් හා දාසයා අතර පවතින සම්බන්ධතාවය පිළිබඳ කරුණු පැහැදිලි කර දෙන මෙන් මෙම ප්‍රදේශ වාසීන් හා වෙනත් නොයෙකුත් උදවීන් මාගෙන් ඉල්ලා සිටියහ. නූහ් (අලෙයිහිස්සලාම්) හා ඔහුට පසු පැමිණි ධර්ම දූතයින් සඳහා අල්ලාහ් අවධාරණය කළ යුතුකමද එයයි. විශේෂයෙන් මුහම්මද් (සල්)[1] තුමාණන් හට අවසාන වශයෙන් පහල කළ ඉස්ලාමීය පණිවුඩය මුද්‍රා කරනු ලැබුවේද එම යුතුකම මඟිනි. සර්ව බලධාරී අල්ලාහ් පාරිශුද්ධ අල්කුර්ආනයේ ඒ පිළිබඳ මුහම්මද් නබි (සල්) තුමාණන් දෙස බලා මෙසේ පවසයි:

ඔහු නූහ් ට අවධාරණය කළ දැය ම නුඹලාටත් ධර්මයක් කළේය. (මුහම්මද්) ඔබට අපි දැනුම් දුන්නේ ද ඉබ්‍රාහීම් , මූසා හා ඊසාට අපි අවධාරණය කළේද "ධර්මය පිහිටුවන්න, එහි භේද නොවන්න"යනුවෙනි.(අෂ්ෂූරා: 13)

පොදුවේ මිනිසුන්ගේ තෘෂ්ණාවන් සහ විවිධ අභිලාශයන් අධික වූ විට තන්හාව වැඩි වේ. තන්හා ආශා අධික වීමත් සමඟ විවිධ මතවාද හට ගැණෙනු ඇත. එම විවිධ මතවාද අධික වීමත් සමඟ විවිධ කොටස් හා කණ්ඩායම් ඇති වීමට ආරම්භ වුණි.

1. මෙය සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් යන සම්පූර්ණ වැකියෙහි කෙටි භාවිතාවයි.එම වැකියෙහි අර්ථය වන්නේ අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය නබි තුමාණන් හට හිමි වේවා යන්නයි.

එසේම ආරාබි භාෂා නිපුණත්වය අරාබිවරුන් හා අරාබි නොවන උදවිය අතුරින් ගිලිහී ගිය වාතාවරණයක් තුළ ජනයා ඉදිරියේ ඉස්ලාම් දහම පිළිබඳ නොයෙකුත් ව්‍යාජ විවරණයන් උපයෝගී කිරීමට සහ පාරිශුද්ධ අල්කුර්ආන් වැකි හා නබි වදන් සඳහා නොයෙකුත් වැරදි අර්ථ නිරූපණයන් ඉදිරිපත් කිරීමට හා අල්කුර්ආන් සහ අල් හදීස් [1] තුළ විවිධ ප්‍රතිපාදන සකස් කිරීමටද එවැනි මතවාදී කණ්ඩායම් වලට පහසු වුනි.ඉස්ලාම් දහමෙහි ආරම්භක අවදියේම මෙසේ ජනයා නොමඟ යැවීමට හැකි වූයේ නම් සියවස් ගණනාවකට පසු වැජඹෙන සමාජය නොමඟ යැවීම ඔවුන්ට කෙතරම් නම් පහසුද යන්න ප්‍රකාශ කිරීමට අවශ්‍ය නැත.අවිශ්වාසය හා සැකයෙහි ප්‍රාරම්භය තෘෂ්ණාවයි. ඉන් පසු එම අවිශ්වාසය එහි අනුගාමිකයින්ගේ ධර්මතාවයක් බවට පරිවර්තනය වී එහි ආරම්භය කෙසේද යන්න පිළිබඳ එම අනුගාමිකයින් අනවබෝධයෙන් පසු වනු ඇත.පාරිශුද්ධ අල්කුර්ආනයේ අල්ලාහ් මෙසේ සඳහන් කරයි.

❁ දූතවරු නුඹලාට අකැමති දේ ගෙනෙන සෑම විටක ම නුඹලා අහංකාර වූවෙහුය.ඇතැමුන් අසත්‍යවාදීන් යැයි කීවෙහුය.ඇතැමුන් ඝාතනය කළෙහු ය.(අල්බකරා: 87)

මෙම අල්කුර්ආන් වැකියෙහි එම ජනයින් උඩඟුකමින් පසු වීමට හේතු වූ තෘෂ්ණාව කෙබඳුද යන්න හා එම තෘෂ්ණාව එම ධර්ම දූතයින් ගෙන ආ ධර්මය ප්‍රතික්ෂේප කිරීමට තරම් උග්‍ර වූ අකාරය කෙසේද යන්න හා එම ප්‍රතික්ෂේප කිරීම සතුරුකමක් වූයේ කෙසේද යන්න මනාව පැහැදිලි කරයි.සෑම සමූහයකම නොමඟ ගිය නොයෙකුත් කණ්ඩායම් හා මතවාද බිහි වන්නේ මේ ආකාරයෙනි.නබි මුහම්මද් (ඔහුට අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය උදා වේවා) තුමාණන් හට සත්‍ය හා යහමඟ පහල කළේ සර්ව බලධාරී අල්ලාහ් ය. කවරෙකු හෝ එම යහමඟ පිවිතුරු ආකාරයෙන් අනුගමනය කිරීමට ප්‍රිය කරන්නේ නම් එම යහමඟ ඔහු උපුටා ගත යුත්තේ සිය බුද්ධියෙන් නොව එම යහමඟෙහි මූලාරම්භයෙනි. තවද වහී හෙවත් දිව්‍යමය හෙළිදරව්ව දිය හා සමාන වේ. මානව බුද්ධිය හෝ මානව අදහස් එම දිය රඳා තබන භාජනය හා සමාන වේ.

ඒ අනුව සර්ව බලධාරී අල්ලාහ් ඔහුගේ දිව්‍යමය හෙළිදරව්ව මුහම්මද් (සල්) තුමාණන්ගේ හදවතෙහි තැන්පත් කළ අතර එතුමාණන් එම දිව්‍යමය හෙළිදරව්ව ඔහුගේ සහගාමීන් වන සහාබිවරුන්ට ඉදිරිපත් කළහ. ඉන් අනතුරුව එම සහාබිවරුන්

---

1. අල්හදීස් යන්නෙහි තේරුම මුහම්මද් (සල්) තුමාණන්ගේ දේශනය වේ.මුහම්මද්(සල්)තුමාණන්ගේ ප්‍රකාශ, ක්‍රියා සහ අනුමතිය ලැබූ ක්‍රියා සියල්ල අල් හදීස් ගණයට ඇතුලත් වේ.එයට සුන්නාහ් යනුවෙන්ද කියනු ලැබේ.

අල්ලාහ්ගේ දිව්‍යමය හෙළිදරව්ව ඔවුනට පසු පැමිණි අනුගාමිකයින්ට ඉදිරිපත් කළහ. මේ ආකාරයෙන් පරම්පරා සංඛ්‍යාව අධික වීමත් සමඟම ව්‍යාජ ආකල්පයන් හා අසත්‍ය මානව අදහස් ධර්මයක් තුළ නන්අයුරින් ඇතුල් විය හැක. මෙහි දම්වැලෙන් ඉතා පිවිතුරු හා නිවැරදි භාජනය (මානව අදහස්) වනාහි ප්‍රථම භාජනයයි. එයින් අදහස් කරනු ලබන්නේ මුහම්මද් (සල්) හා ඔහුගේ සහාබිවරුන් වේ. ඉමාම් මුස්ලිම්(රහ්)තුමාණන් තම හදීස් ග්‍රන්ථයේ නබි (සල්) තුමාණන් පැවසූ බව අබූ මූසා (රළි)[1] තුමා වාර්තා කරන නබි වදනක් මෙසේ සඳහන් කරයි.

- මා මාගේ සහගාමීන් සඳහා ආරක්ෂාවරණයකි.මාගෙන් පසු මාගේ සහගාමීන්ට පොරොන්දු වූ දෑ පැමිණෙනු ඇත. මාගේ සහගාමීන් මාගේ ජන සමාජය සඳහා ආරක්ෂාවරණයකි.මාගේ සහගාමීන්ට පසු මාගේ ජන සමාජයට පොරොන්දු වූ දෑ පැමිණෙනු ඇත. (මුස්ලිම්: වැකි අංක 2531)

එසේනම් ධර්මය උපුටා ගනු ලබන්නේ දිව්‍යමය හෙළිදරව්ව වන අල්කුර්ආනය හා නබි මඟෙන් පමණි.ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

- කියවීමට හා ලිවීමට නොදන්නා ජන සමාජයෙන් ඔවුන්ගෙන් ම දූතයෙකු එව්වේ ඔහුමය. ඔහු ඔවුනට ඔහුගේ වැකි ප්‍රකාශ කරයි. ඔවුන් පවිත්‍ර කරයි. ඔවුනට ධර්ම ග්‍රන්ථය හා ප්‍රඥාව උගන්වයි.(අල්ජුම්ආ: 02)

මෙම සාධක දෙක පදනම් නොවූ ආගමික විෂයන් සියල්ල අඥාන හා ව්‍යාජ ඒවා වේ. දිව්‍යමය හෙළිදරව්ව ඉතා නිවැරදිව අවබෝධ කරගැනීමට නම් සහාබිවරුන්ගේ අවබෝධය හා ඔවුන්ගේ අදහස් අත්‍යාවශ්‍යයි. එබැවින් දිව්‍යමය හෙළිදරව්වට අනුව හා සහාබිවරුන් අවබෝධතාවයට අනුව හා සියවස් වලින් අති විශිෂ්ඨ සියවස්වල ජීවත් වූ විද්වතුන් එකඟ වූ කරුණු මගින් මෙම පොත රචනා කළෙමි.

කතෘ.

---

1. රළියල්ලාහු අන්හු යන අරාබි වාක්‍යයෙහි කෙටි භාවිතය යි.එහි අර්ථය නම් අල්ලාහ් ඔහුව පිළිගනිත්වා යන්න වේ.මේ අයුරින් සහාබිවරයකුගේ නමක් සඳහන් කිරීමේදී ප්‍රකාශ කිරීම සිරිතකි.

# පළමුවෙනි පාඩම

## ඉස්ලාම්:

ඉස්ලාම් යනු සර්ව බලධාරී අල්ලාහ් පහල කළ ඒකීය දහමකි. ඔහුගේ ගැත්තන් වන පින්වරුන් හා මිනිසුන් වෙතින් මෙම ඉස්ලාම් දහම හැර කිසිවක් ඔහු පිළි ගන්නේ නැත.ඒ පිළිබඳ මෙසේ පාරිශුද්ධ අල්කුර්ආනයේ සඳහන් වේ.

යමෙක් ඉස්ලාම් නොවන දහමක් ප්‍රිය කරන්නේ නම් ඔහුගෙන් එය කිසිවිටකත් පිළි ගනු නොලැබේ. ඔහු පරලොවෙහි අලාභ ලද්දෙක් වන්නේ ය.(ආලුඉම්රාන්: 85)

ඉස්ලාම් යනු සියලු ධර්ම දූතවරුන් ගෙන ආ දහමකි. ඒ පිළිබඳ පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

- "මා හැර නැමදීමට සුදුස්සා අන් කිසිවෙක් නැත. එබැවින් මට ම නමදින්න" යනුවෙන් දැනුම් නොදී ඔබට පෙර අපි කිසිදු දූතයෙකු නොඑව්වෙමු.(අල් අන්බියා: 25)

තවද මෙසේ සඳහන් වේ:

- නූහ්ට ද ඔහුට පසුව පැමිණි නබිවරුන්ට ද දේව පණිවුඩ පහළ කළා සේ: මුහම්මද් ඔබට ද අපි දේව පණිවුඩ පහළ කළෙමු.ඉබ්‍රාහිම් , ඉස්මායිල්, ඉස්හාක්,යඃකූබ්,(ඔහුගේ) පෙළපත, ඊසා, අය්යූබ් , යූනුස් , හාරූන් , සුලෙයිමාන් යන අයට ද දේව පණිවුඩ පහළ කළෙමු. දාවූද්ට සබූරය ද පිරිනැමුවෙමු. (මුහම්මද්) මීට පෙර ඇතැම් දූතයින්ගේ ඉතිහාසය ඔබට ප්‍රකාශ කර ඇත්තෙමු.ඇතැම් දූතයින්ගේ ඉතිහාසය අපි ඔබට ප්‍රකාශ නොකළෙමු. අල්ලාහ් මූසා සමග සැබවින් ම සම්භාෂණය කළේ ය. දූතයින් එවීමෙන් පසුව අල්ලාහ්ට දොස් පැවරීමට මිනිසුන්ට කිසිදු සාධකයක් නොමැති විය යුතු බැවින් සුභාරංචි කියා අවවාද කරන දූතයින් ඔහු එවීය. අල්ලාහ් අභිබවන්නෙකු ද ප්‍රඥාවන්තයෙකු ද වේ.(අන්නිසා: 163-165)

අල්කුර්ආනයේ සර්ව බලධාරී අල්ලාහ් නබි මුහම්මද් (සල්) තුමා හට නූහ්, ඉබ්‍රාහීම්, ඉස්හාක්, යාකූබ් වැනි ධර්ම දූතයින්ව මෙනෙහි කර මෙසේ පවසයි:

- අල්ලාහ් යහමග පෙන් වූ අය ඔවුහුමය. එබැවින් ඔවුන්ගේ මාර්ගය (මුහම්මද්) ඔබත් අනුගමනය කරන්න.(අල්අන්ආම්: 90)

සියලු ධර්ම දූතවරුන් ගෙන ආ දහමෙහි මූලික ප්‍රතිපත්ති විග්‍රහය එක හා සමාන වූ අතර එහි අතිරේක ශාඛාවන්හි වෙනසක් සිදු වනු ඇත.ඒ සඳහා කදිම උදාහරණයක් නම් උත්තරීතර අල්ලාහ් බනූ ඉස්රාඊල් වරුන් වෙත මූසා (අලෛයිහිස්සලාම්)[1] තුමාට පසු ඊසා (අලෛයිහිස්සලාම්) තුමාව පහල කළ අවස්ථාවේදී මූසා (අලෛයිහිස්සලාම්) තුමාණන් හට පහල කරන ලද තෝරාවෙහි තිබුණු ඇතැම් කරුණු ස්වල්පයක් ඊසා (අලෛයිහිස්සලාම්) තුමාණන් හට පහල කළ ඉන්ජීල් මගින් අවලංගු කරනු ලැබිණි. ඒ පිළිබඳ පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

- "මට පෙර පැවති තව්රාතය සත්‍ය කරවීමට ද නුඹලාට තහනම් කරන ලද දැයින් ඇතැම් දේවල් අනුමත කිරීමට ද නුඹලාගේ දෙවියන් වෙතින් සාධකයක් සමග නුඹලා වෙත පැමිණියෙමි. එබැවින් අල්ලාහ්ට බිය වන්න. මට අවනත වන්නැ" යි ද පැවසී ය.(ආලුඉම්රාන්: 50)

මූසා හා ඊසා(අලෛයිහිස්සලාම්) යනු එකම සමාජයක් සඳහා එවන ලැබූ ධර්ම දූතයින් වෙති. එසේ තිබියදී ඔවුන් ගෙන ආ දහමෙහි අතිරේක විෂයන්හි එක්තරා වෙනසක් ඇති වුණි. මේ ආකාරයෙන් හුදෙක් එක් ජන සමාජයක් සඳහා පැමිණි ආගමක අතිරේක විෂයන්හි වෙනසක් ඇති වූයේ නම් විවිධ ජන සමාජය සඳහා පැමිණි ආගම් වල අතිරේක විෂයන්හි විවිධත්වයක් ඇති වීම යනු සුලබ කරුණකි යන්න මනා ලෙස වටහා ගැනීමට හැක.

නබි මුහම්මද් (සල්) තුමාගේ කාලවකවානුවට පෙර තිබූ සෑම දහමක්ම එක්තරා ආකාරයෙන් සංශෝධනයට ලක් වී විකෘතිමත් ස්වභාවයකින් තිබුණි. ඒ පිළබඳ පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ වාර්තා වේ.

- ඔවුන් අතර පිරිසක් සිටිති. ඔවුහු ධර්ම ග්‍රන්ථයෙහි නොමැති දෙයක් ධර්ම ග්‍රන්ථයෙන් යැයි නුඹලා සිතනු පිණිස ධර්ම ග්‍රන්ථය කියවන්නාක් මෙන් තමන්ගේ දිව් හරවති. එය අල්ලාහ් වෙතින් පැමිණියේ යැයි ද පවසති. එය අල්ලාහ් වෙතින් පැමිණි දෙයක් නොවේ. ඔවුහු දැන දැන ම අල්ලාහ්ගේ නාමයෙන් අසත්‍ය පවසති. (ආලුඉම්රාන්: 78)

1. අලෛයිහිස්සලාම් යන වදනෙහි අර්ථය නම් අල්ලාහ්ගේ ශාන්තිය ඔහුට අත් වේවා යන්නයි.ධර්ම දූතයකුගේ හෝ දේව දූතයකුගේ නමක් සඳහන් වීමේදී මෙසේ ප්‍රකාශ කළ යුතුයි.

තවද මෙසේ වාර්තා වේ:

- ඇතැම්හු වචන ඊට අදාළ තැන්වලින් වෙනස් කරති.(අන්නිසා: 46)

මෙම අල්කුර්ආන් වැකි මගින් පැහැදිලි වන කරුණ නම් සත්‍ය වෙත යොමු වීමෙන් සාමාන්‍ය ජනයා නොමග යෑමකට භාජනය වී ඇති බවයි. එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා නව දිව්‍යමය හෙළිදරව්වක් පහළ කිරීමේ අත්‍යාවශ්‍යතාවයක් ඇති වුණි. ඒ අනුව සර්ව බලධාරී අල්ලාහ් තම සත්‍ය දහම මුහම්මද් (සල්) තුමා හට අවසාන වශයෙන් නැවත ලබා දුන්හ.අවසාන වශයෙන් පහළ වූ නබි(සල්) තුමාගේ එම දහම හැර වෙනත් කිසි දහමක් හෝ යහමගක් නොමැත.ඒ පිළිබඳ පාරිශුද්ධ අල්කුර්ආනයෙහි මෙසේ වාර්තා වේ:

- යමෙක් ඉස්ලාම් නොවන දහමක් ප්‍රිය කරන්නේ නම් ඔහුගෙන් එය කිසිවිටකත් පිළිගනු නොලැබේ.ඔහු පරලොවෙහි අලාභ ලද්දෙක් වන්නේ ය.(ආලුඉම්රාන්: 85)

එපමණක් නොව එම අවසාන පණිවුඩය ලෝකයේ සෑම ජන කොට්ඨාශයක් සඳහා වලංගු වන පරිදි ජාති භේදයකින් තොරව මිනිසුන් හා ජින්වරුන් සියල්ල සඳහා අල්ලාහ් විසින් සකස් කරන ලදී. පාරිශුද්ධ අල්කුර්ආනයෙහි මෙසේ සඳහන් වේ:

- (මුහම්මද්)සුභාරංචි කියන්නෙකු ලෙස ද අවවාද කරන්නෙකු ලෙස ද මුළු මානව සංහතියට ම අපි ඔබ එවා ඇත්තෙමු. නමුත් මිනිසුන්ගෙන් වැඩි දෙනෙක් නොදනිති.(සබඃ: 28)

සහීහ් මුස්ලිම් ග්‍රන්ථයෙහි අබූ හුරයිරා (රළි) තුමා විසින් මෙසේ වාර්තා වේ:

- මුහම්මද්ගේ ආත්මය කවරෙකු සතුව තිබෙන්නේද ඔහු මත දිවුරා පවසමි! මෙම සමාජයෙන් යුදෙව්වන්ගෙන් හෝ කිතුනුවන්ගෙන් කවරෙකු හෝ මා පිළිබඳ ආරංචි වී මා රැගෙන ආ විෂයන් විශ්වාස නොකරමින් මිය යන්නේ නම් ඔහු නිරාගත වනු ඇත යනුවෙන් නබි (සල්) තුමාණන් වදාළහ.(මූලාශ්‍රය: මුස්ලිම්/153)

අවසාන වශයෙන් පහළ වූ මෙම දිව්‍යමය හෙළිදරව්ව වන පාරිශුද්ධ අල්කුර්ආනය කුමන හෝ ආකාරයකින් කිසිදා සංශෝධනයකට හා වෙනස් කිරීමකට භාජනය වීමෙන් සර්ව බලධාරී අල්ලාහ් එය ආරක්ෂා කරනු ඇත.ඒ පිළිබඳ මෙසේ අල්කුර්ආනයේ සඳහන් වේ:

- අපිම මෙම උපදේශය පහළ කළෙමු.අපිම එය ආරක්ෂා කරන්නෙමු.(අල්හිජ්ර්: 09)

# දෙවන පාඩම

## ඉස්ලාම් දහම යනු කුමක්ද යන්න හා ඒවායින් අල්ලාහ් අපේක්ෂා කරන්නේ කුමක්ද යන්න පිළිබඳ විස්තර කළ හැක්කේ ඔහුගේ දේව ග්‍රන්ථය වන අල්කුර්ආනයට හා නබි (සල්) තුමාගේ මඟ පෙන්වීම් වලට පමණි.

මිනිසුන් අතුරින් නබි මුහම්මද්(සල්) තුමාණන් ඉතා ශ්‍රේෂ්ඨවන්තයෙකි. එසේ තිබියද ඔහු අල්ලාහ්ගේ අණ පනත් ජනයින් හට ප්‍රකාශ කරන හුදෙක් මානව වර්ගයට අයත් ධර්ම දූතයෙකු පමණි.පාරිශුද්ධ අල්කුර්ආනයේ ඒ පිළිබඳ මෙසේ සඳහන් වේ:

- දූතයාණෙනි! ඔබේ දෙවියන් වෙතින් ඔබට පහළ වූ දේ පැහැදිලිව ප්‍රකාශ කරන්න.(අල්මාඉදා: 67)

නබිවරයෙකු දිව්‍යමය හෙළිදරව්ව ජනයාට ප්‍රකාශ කිරීමේදී එය පැහැදිලිව ප්‍රකාශ කිරීමද එක් කොන්දේසියකි.ඒ පිළිබඳ පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

- පැහැදිලිව ප්‍රකාශ කිරීම මිස අන් කිසිවක් මෙම දූතයා කෙරෙහි පැවරී නැත.(අන්නූර්: 54)

එම පැහැදිලි කිරීමද පැමිණිය යුත්තේ සර්ව බලධාරී අල්ලාහ් වෙතිනි.පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

- එබැවින් අපි එය පාරායණා කරන විට ඒ පාරායණය අනුගමනය කරන්න.පසුව එය පැහැදිලි කිරීම අප සතු කාර්යයකි.(අල්කියාමා: 18/19)

සුන්නාහ් හෙවත් නබි(සල්) තුමාගේ මඟ පෙන්වීම වනාහිද අල්ලාහ් වෙතින් පැමිණි එක් දේව හෙළිදරව්වකි. පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

- ඔහු චිත්තාභිලාෂයට අනුව කථා නොකරයි . එය(ඔහු කථා කරන දෑය)දැනුම් දෙනු ලබන පුවතක් මිස වෙන නැත.(අන්නජ්ම්: 3/4)

ඒ අනුව නබි (සල්) තුමා වෙත යම්කිසි පැනයක් අසනු ලැබූ කල්හි එම පැනය හා අදාල පෙර පැමිණි යම් දිව්‍යමය හෙළිදරව්වක් තිබුණේ නම් ඒ සඳහා සැනින්

පිළිතුරු සපයනු ඇති අතර එසේ නොමැති නම් දිව්‍යමය හෙළිදරව්ව පහළ වන තෙක් බලාපොරොත්තුවෙන් සිටී.

නබි (සල්) තුමාණන්ව මනා ලෙස අවබෝධ කළ හැකි උදවියන් අතුරින් ඉතා සමීප උදවිය වන්නේ සහාබිවරුන් ය.ඒ අනුව එම සහාබිවරුන් අල්කුර්ආනය සඳහා ලබා දුන් විවරණ හා පැහැදිලි කිරීම් (අල්කුර්ආනයට හා සුන්නාහ්වට පටහැනිව නොතිබෙණ තාක්) ඉස්ලාම් දහමෙහි එක් ප්‍රධාන සාධකයක් ලෙස ගනු ලැබේ.

ඉස්ලාම් දහම තුළ යම් දෙයක් අනුමත කිරීමේ සහ තහනම් කිරීමේ අයිතිය අල්ලාහ් හැර අන් කිසිවෙකු සතුව ඇතැයි කවරෙකු හෝ ප්‍රකාශ කරයි නම් නියත වශයෙන්ම ඔහු අල්ලාහ් සමඟ ඔහුගේ ආධිපත්‍යයෙහි වෙනත් කෙනෙකු ආදේශ කළ අයෙකු වේ. මෙය දේව ප්‍රතික්ෂේපයක් හා දහමෙන් බැහැර කරවන විෂයකි.ඒ පිළිබඳ ඉස්ලාමීය විද්වතුන් අතර කිසි මත භේදයක් නොමැත.

සර්ව බලධාරී අල්ලාහ් ඔහුගේ හෙළිදරව්ව වන අල්කුර්ආනය පහල කළේ එහි අන්තර්ගත වී ඇති වදන් මගින් යම්කිසි අර්ථයක් අපේක්ෂා කරමිනි. එම අර්ථය විස්තර කළ හැක්කේ ඔහුට හා ඔහු කවරෙකු සඳහා අනුමැතිය ලබා දුන්නේද එම උදවිය හට පමණි.

ඒ අනුව පාරිශුද්ධ අල්කුර්ආනය පිළිබඳ ස්වයං ගවේෂණයක නිරත වන පුද්ගලයෙකු පහත සඳහන් කොන්දේසි දෙක සම්පූර්ණ කළ යුතුයි.

- ශිෂ්ඨ අරාබි භාෂාව පිළිබඳ හසලක දැනුමක් තිබිය යුතුයි. අල්කුර්ආනයේ ව්‍යාකරණට , භාෂාවේ භාවිතයට සහ එහි ශෛලයට පටහැනිව ඔහුගේ අදහස නොතිබිය යුතුයි.
- පාරිශුද්ධ අල්කුර්ආනයේ ප්‍රකාශිත පැහැදිලි අදහසකට හෝ මතයකට මොහුගේ අදහස විරුද්ධ නොවීම.

පොදුවේ ගත් කළ ඇතැම් උදවිය මගින් සර්ව බලධාරී අල්ලාහ් සමඟ සම්බන්ධ කරනු ලබන අදහස් උදහස් සියල්ල දෙවියන් අල්ලාහ් පැවසූ අදහස් නොවනු ඇත.මන්දයත් මෙම විෂයෙහි ධර්ම ග්‍රන්ථ හිමි අයවලුන් බොහෝමයක් ඔවුනට පහළ වූ දේව ග්‍රන්ථයේ තිබෙන නියතාර්ථ හා උභයාර්ථ විකෘතිමත් කිරීම මගින් හා අල්ලාහ් අපේක්ෂා කරන අදහසෙන් ජනයින් නොමග යවන්නට තැත් කළහ. පාරිශුද්ධ අල්කුර්ආනයේ ඒ පිළිබඳ මෙසේ සඳහන් වේ:

- ඔවුන් අතර පිරිසක් සිටිති. ඔවුහු ධර්ම ග්‍රන්ථයෙහි නොමැති දෙයක් ධර්ම ග්‍රන්ථයෙන්

යැයි නුඹලා සිතනු පිණිස ධර්ම ග්‍රන්ථය කියවන්නාක් මෙන් තමන්ගේ දිව් හරවති. එය අල්ලාහ් වෙතින් පැමිණියේ යැයි ද පවසති. එය අල්ලාහ් වෙතින් පැමිණි දෙයක් නොවේ. ඔවුහු දැන දැන ම අල්ලාහ්ගේ නාමයෙන් අසත්‍ය පවසති.(ආලුඉම්රාන්: 78)

මෙම අල්කුර්ආන් වැකියෙහි අල්ලාහ් පවසන්නේ "ධර්ම ග්‍රන්ථය කියවන්නාක් මෙන් තමන්ගේ දිව් හරවති" යනුවෙනි.ඒ අනුව අල්ලාහ්ගේ වදන් වන ධර්ම ග්‍රන්ථය හැර වෙනත් දෙයක් ඔවුන් ඒ සඳහා උපයෝගි නොකළ බව පැහැදිලි වේ.

"නුඹලා සිතනු පිණිස" යන්නෙහි අර්ථය නම් ඔවුන් කරන එම ක්‍රියාව දේව වාක්‍ය වලට ඉතා සමීප හෙයින් ජනයින් නොමඟ යැවීම සඳහා මෙසේ කටයුතු කරති යන්නයි.

# තුන්වන පාඩම

## අල්ලාහ් වෙනුවෙන් කළ යුතු දෑ:

මුස්ලිම්වරයෙකු අල්ලාහ් වෙනුවෙන් කළ යුතු ප්‍රධාන යුතුකම නම් අනුමැතිය ඇති සියලුම වන්දනාමාන ක්‍රම මගින් ඔහුට පමණක් වන්දනාමාන කිරීමයි. උත්තරීතර අල්ලාහ් පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ පවසයි:

නුඹලාගේ නැමදීමට සුදුස්සා එකම එක් දෙවියෙකි. ඔහු හැර නැමදීමට සුදුස්සා වෙනත් කිසිවෙක් නොමැත. ඔහු අසීමිත කරුණාවන්තයාය, අසමසම දයාවන්තයා ය.(අල්බකරා: 163)

තවද සිත, කය හා ප්‍රකාශ සම්බන්ධ වන්දනාවන්හිදී ඔහුට සමානයන් උපකල්පනය කිරීමෙන් බැහැරව සිටීමද අල්ලාහ්ට කළ යුතු එක් යුතුකමකි.උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි:

- අල්ලාහ් ම නමදින්න. ඔහුට සමානව කිසිවක් නොසිතන්න.(අන්නිසා: 36)

ෂිර්කුල් අක්බර් හෙවත් මහා ආදේශ කිරීම මිනිසා කළ කිසිදු ආනිසංසයක් ඉතුරු නොකරයි.පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

- "ඔබ සමානයන් කල්පනය කළෙහි නම් ඔබේ යහපත් ක්‍රියා විනාශ වනු ඇත.නියත වශයෙන්ම ඔබ අලාභ ලද්දෙක් වන බව ඔබට හා ඔබට පෙර සිටි අයටත් දූත පණිවුඩ දැනුම් දෙන ලදී.(අස්සුමර්: 65)

මෙම අල්කුර්ආන් වැකිය මගින් අවවාද කරනු ලැබුවේ අල්ලාහ්ගේ අවසන් ධර්ම දූතයා වන මුහම්මද් (සල්) තුමාණන් ය. එසේ නම් සාමාන්‍ය මිනිසෙකුගේ තත්ත්වය කෙසේ විය හැකිද?

ෂිර්ක් හෙවත් සමානයන් උපකල්පනය කිරීමේ පාපය සඳහා පාපොච්ඡාරණයෙන් තොරව අල්ලාහ්ගෙන් සමාව හිමි වන්නේ නැත. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි:

- අල්ලාහ් තමාට සමානයන් කල්පනය කරනු ලැබීම ක්ෂමා නොකරයි. ඔහු සිතූ අයට ඊට පහත් මට්ටමෙන් යුත් දේ(පාපය)ක්ෂමා කරයි.(අන්නිසා: 48)

තවද මෙසේ ප්‍රකාශ කරයි:

- (ඒකම දෙවියන්) ප්‍රතික්ෂේප කොට අල්ලාහ්ගේ මාර්ගයෙන් වළක්වා පසුව ප්‍රතික්ෂේප කරන්නන් ලෙස මරණයට පත් වූ අයට අල්ලාහ් කිසිසේත් ම ක්ෂමා නොකරයි. (මුහම්මද්: 34)

තවද කවරෙකු කාෆිර් හෙවත් ප්‍රතික්ෂේප කරන්නෙකු ලෙස මිය යන්නේද ඔහු මතු ලොවෙහි නරකාදියෙහි සිටිනු ඇත.උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි:

- නුඹලාගෙන් යම් කෙනෙක් තම ධර්මයෙන් හැරී(ඒකම දෙවියන්) ප්‍රතික්ෂේප කරන්නෙකු ලෙස මරණයට පත් වුයේ නම් එවැන්නන්ගේ ක්‍රියා මෙලොවදීත් පරලොවෙදීත් නිෂ්ඵල වනු ඇත. ඔවුහු නිරාවාසිහු ය. ඔවුහු එහි සදාකාලීනව සිටිති.(අල්බකරා: 217)

තවද මෙසේ ප්‍රකාශ කරයි:

- (ඒකම දෙවියන්) ප්‍රතික්ෂේප කොට ප්‍රතික්ෂේපිතයින් ලෙසින් ම මරණයට පත් වූ අය කෙරෙහි අල්ලාහ්ගේ ශාපය ද සුර දූතයින්ගේ හා සියලු(යහපත්) මිනිසුන්ගේ ශාපය ද ඇත.(අල්බකරා: 161)

ඇතැම් විට කාෆිර්වරයෙකු ජනයින් සඳහා ප්‍රයෝජනවත් ලෙස මෙලොවෙහි ජීවත් වන්නට පුළුවනි. එසේ සිදු වන්නේ උත්තරීතර අල්ලාහ් මිනිසුන් හට ප්‍රයෝජනයක් ලබා දීම සඳහා දියත් කළ උපාය මාර්ගයකි. ඉර ,හඳ වළාකුලු හා සුළඟ වැනි සොබා දහමේ තිබෙන වස්තූන් රාශියක් අල්ලාහ් මවා තිබෙන්නේ කුමන හේතුව මතද එම දේව ප්‍රතික්ෂේපකයා මවා තිබෙන්නේද එම හේතුව මතයි.තවත් පවසනවා නම් ඒවා ඔහුට වඩා වැඩි ප්‍රයෝජනයක් මිනිසා හට ලබා දෙනු ඇත.එසේම කුෆ්ර් යන දේව ප්‍රතික්ෂේපය සිදු වන්නේ අල්ලාහ්ව ප්‍රතික්ෂේප කිරීම මගිනි. ඒ අනුව දේව ප්‍රතික්ෂේපය සිදු කරන්නාට දඬුවම හිමි වන්නේ ඔහු සොබා දහම ප්‍රතික්ෂේප කළ හේතුවට නොව අල්ලාහ්ව ප්‍රතික්ෂේප කළ හේතුවෙනි.

# සිව්වන පාඩම

## ඊමාන් හෙවත් දේව විශ්වාසය හා කුෆ්ර් හෙවත් දේව ප්‍රතික්ෂේපය.

*දේව විශ්වාසය හා දේව ප්‍රතික්ෂේපය යනු අල්ලාහ්ට පමණක් නිර්නය කළ හැකි සංකල්පයන් හා නාමයන් දෙකකි.ඒ අනුව කිසියම් බාහිර සාධකයක් හෝ ආධාරයක් නොමැතිව කවරෙකු හෝ කාෆිර් යැයි තීරණය කළ නොහැක. විශ්වයේ මිනිසුන් කොටස් දෙකකි. එහි තුන්වන කොටසක් නොමැත. එම කොටස් දෙක නම් විශ්වාස කළ උදවිය හා ප්‍රතික්ෂේප කළ උදවිය වේ. උත්තරීතර අල්ලාහ් පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ පවසයි:*

- *නුඹලා නිර්මාණය කළේ ඔහු ය.නුඹලා අතර (එකම දෙවියන්) ප්‍රතික්ෂේප කරන්නෝ ද සිටිති.නුඹලා අතර විශ්වාස කළ අය ද සිටිති.(අත්තගාබුන්: 2)*

*මෙම දෙපිරිස හා සම්බන්ධ නීති රීතින් අල්ලාහ් පහළ කළ පාරිශුද්ධ අල්කුර්ආනය හා නබි(සල්)තුමාණන්ගේ මඟ පෙන්වීම් මඟින් පනවන ලද නීති රීතීන් වේ.*

## මුනාෆික් හෙවත් කුහකයින් හා වංචනිකයින්.

- *ඔවුන් කොටස් දෙකකි: ප්‍රථම කොටස:*

*අභ්‍යන්තරයෙන් කුෆ්ර් හෙවත් දේව ප්‍රතික්ෂේපය සඟවා ඊමාන් හෙවත් දේව විශ්වාසය බාහිරව පෙන්වන පුද්ගලයින් වේ: තවද ඔවුන් අල්ලාහ් හා ඔහුගේ පුස්තකයන් හා ඔහුගේ ධර්ම දූතයින් පිළිබඳ විශ්වාසය බාහිරව ස්ථිර කළද අභ්‍යන්තර සිතෙහි ඒවා අසත්‍ය යැයි විශ්වාස කරන උදවීන් වෙති. මෙය විශාල කුහකත්වය ලෙස හඳුන් වනු ලබයි.*

- *දෙවන කොටස:*

*දේව ප්‍රතික්ෂේපය නොව සාමාන්‍ය පාපයක් හෝ අකුසලක් සිතෙහි සඟවා බාහිරව කුසලක් ප්‍රදර්ශනය කරන සාමාන්‍ය මුස්ලිම්වරුන් වෙති.*

*උදාහරණයක් ලෙස යම්කිසි ගිවිසුමක් උල්ලංඝනය කළ යුතුයි යන චේතනාවෙන් යම්*

ගිවිසුමක් ගිවිස ගැනීම හා කතාවෙහි සත්‍යතාවය තහවුරු කරමින් සිතෙහි එයට පටහැනිව යම් දෙයක් සිතීම යනාදී විෂයන් වේ.මෙය කුඩා කුහකත්වය ලෙස හඳුන් වනු ලබයි.

මෙවන් කුහකයින් සමඟ බාහිරව කටයුතු කළ යුත්තේ සාමාන්‍යයෙන් මුස්ලිම්වරයෙකු සමග කටයුතු කරන ආකාරයෙනි. සිතෙහි සඟවා ඇති විෂයන් සඳහා භාරකරු අල්ලාහ් වේ.

මුස්ලිම්වරයෙකුගේ ධන සම්පත් හා ඔහුගේ ආත්මය යනා දී දෑ සංරක්ෂිත විය යුතු අතර ඒවා අනාරක්ෂිතව තැබීම තහනම් වේ. මෙය ඉස්ලාම් දහමෙහි මූලික ස්ථාවරයක් හා ප්‍රතිපත්තියකි.එනමුත් දේව ප්‍රතික්ෂේප කරුවෙකුගේ ස්ථාවරය එසේ නොවේ.

එසේම මෙම නීතිය සෑම අවස්ථාවකම ක්‍රියාත්මක වන පොදු නීතියක් නොවේ යන්නද පැහැදිලිව සඳහන් කළ යුතුයි.ඒ සඳහා කදිම උදාහරණයක් නම් ඉස්ලාමීය පාලනයක් යටතේ මුස්ලිම්වරුන් සමග ගිවිස ගත් කාෆිර් වරයෙකුගේ ආත්මය සඳහා ආරක්ෂාව සපයන ලෙස ඉස්ලාම් දහම පවසයි.මෙහිදී ඔහු මුස්ලිම්වරයෙකු නොවුවද ඔහුගේ ආත්මය ආරක්ෂා කරනු ලැබේ.ඊට පටහැනිව මුස්ලිම්වරයෙකු විසින් තවත් මුස්ලිම්වරයෙකු ඝාතනය කරනු ලැබීම හෝ විවාහයට පසු දුරාචාරයේ යෙදීම යන වැරදි සඳහා ඔහු මුස්ලිම්වරයකු වුවද එකී පුද්ගලයා ඝාතනය කළ යුතු බවද ඉස්ලාම් දහම අණ කර ඇත.

අල්ලාහ් හා ඔහුගේ ධර්ම දූතයාණන් කවරෙකු කාෆිර් යැයි ප්‍රකාශ කර තිබේද ඔවුන් හැර අන් කිසිවෙකු කාෆිර් යැයි තීන්දු කළ නොහැක.ඒ අනුව කාෆිර් යැයි කියනු ලැබූ පිරිස අතුරින් ඇතැමුන් පහත දැක්වේ:

- සර්ව බලධාරී අල්ලාහ් හා ඔහුගේ ධර්ම දූතයාණන් අසත්‍ය බව ප්‍රකාශ කරන්නන්.
- අල්ලාහ් හා ඔහුගේ ධර්ම දූතයාණන්ව නින්දා කරන්නන්.මේ පිළිබඳ සර්ව බලධාරී අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

  නුඹලා අල්ලාහ්,ඔහුගේ වැකි හා ඔහුගේ දූතයා ගැන ද, විහිළු කරමින් සිටින්නේ ? යැයි අසන්න. නිදහසට කරුණු නොකියන්න. නුඹලා විශ්වාස කළ පසු ප්‍රතික්ෂේප කළෙහු ය. අපි නුඹලාගෙන් පිරිසකට ක්ෂමා කළත් අනෙක් පිරිසට ඔවුන් වැරදි කරමින් සිටි බැවින් දඬුවම් කරන්නෙමු.(අත්තව්බා: 65/66)

- අල්ලාහ් හා ඔහුගේ ධර්ම දූතයාට අවනත නොවී ඔවුනට එරෙහිව උඩඟුකමින් කටයුතු කරන්නන්.

- ඉස්ලාම් දහමෙහි ස්ථිර ලෙස තහවුරු වූ සංකල්පයන් ප්‍රතික්ෂේප කරන්නන්.
- අල්ලාහ් කෙරෙහි අසත්‍ය ප්‍රබන්ධ පළ කරන්නන්. ඒ පිළිබඳ පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ.

  අසත්‍ය ප්‍රබන්ධ පළ කරන්නේ අල්ලාහ්ගේ වැකි ගැන විශ්වාස නොකරන අය ම ය.අසත්‍ය පවසන්නෝ ඔවුහු ම ය.(අන්නහ්ල්: 105)

  තවද අල්ලාහ් පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

  අල්ලාහ් කෙරෙහි අසත්‍යය ප්‍රබන්ධ කරන්නාට වඩා හෝ තමා වෙත පැමිණි සත්‍යය අසත්‍ය යැයි සිතූ තැනැත්තාට වඩා හෝ මහා අපරාධකරුවා කවරෙක් ද ? එකම දෙවියන් ප්‍රතික්ෂේප කරන අයට නිරයෙහි නවාතැනක් නැතිද ? (අන්කබූත්: 68)

- ඒකීය අල්ලාහ් නොවන අන් අයෙකුට වන්දනාමාන කරන්නන්. ඒ පිළිබඳ අල්ලාහ් පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

  යමෙකු අල්ලාහ් සමඟ වෙනත් දෙවියෙකු කැඳවූයේ නම් ඒ ගැන ඔහුට කිසිදු සාධකයක් නැත. ඔහුගේ විමසුම ඔහුගේ දෙවියන් වෙත ඇත.(එකම දෙවියන්) ප්‍රතික්ෂේප කරන්නෝ ජය නොලබති.(අල්මුඃමිනූන්: 117)

  එම වන්දනාව අල්ලාහ් හැර පූර්ණ වශයෙන් අන් අයෙකුට පමණක් කළද නැතහොත් වන්දනාවේදී අන් අයව මැදිහත්කරුවන් ලෙස පත් කළද එය ඉස්ලාම් දහමෙන් බැහැර කරවන පාපයක් වන කුෆ්ර් හෙවත් දේව ප්‍රතික්ෂේපයකි.පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

  ඔවුහු අල්ලාහ් හැර ඔවුනට යහපත් හෝ අයහපතක් හෝ නොකරන දෑයට නැමදුම් කරති."මොවුහු අල්ලාහ් වෙත අප වෙනුවෙන් මැදිහත් වන්නෝ වෙති යැ"යිද පවසති. "අහස්හි ද පොළොවහි ද අල්ලාහ් නොදන්නා දේ නුඹලා ඔහුට කියා දෙන්නෙහු ද? ඔහු සුවිශුද්ධවන්තයා ය. ඔවුන් කල්පනය කරන සමානයන් කෙරෙන් ඔහු උත්කෘෂ්ට යැයි පවසන්න.(යූනුස්: 18)

- අල්ලාහ්ට පමණක් අයිති විෂයන්හි අන් අය කෙරෙහිත් අයිතිය ඇතැයි විශ්වාස කරන උදවිය. උදාහරණයක් ලෙස අල්ලාහ් හැර අන් අයෙකුට ෂරීආ නීති සම්පාදනය කළ හැකි බව හා යම් දෙයක් තහනම් කිරීමට සහ අනුමැතිය ලබා දීමට හැකි බව විශ්වාස කිරීම වේ. යම් දෙයක් ධර්මානුගත කිරීම හා නීති ගත කිරීමේ බලය යනාදී

දෑ වන්දනාවට අයත් විෂයන් බව අල්ලාහ් නම් කර ඇත.ඒ බව දන්වන අල්කුර්ආන් වැකියක් පහත දැක්වේ:

බලය (නීතිය) අල්ලාහ්ට මිස අන් කිසිවෙකුට නැත. ඔහු හැර අන් කිසිවකට නැමදුම් නොකළ යුතුයැයි ඔහු අණ කර ඇත.(යූසුෆ්: 40)

- සාස්තර කාරයින් හා පේජාතිෂප වේදීන් සතුව ගුප්ත ඥානය තිබෙන බව විශ්වාස කරන්නන්.පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

"අහස් හි ද පොළොවෙහි ද ගුප්ත දෑය අල්ලාහ් හැර අන් කිසිවෙක් නොදන්නා බවත් තමන් පණ ගන්වනු ලබන්නේ කවරදා දැයි ද ඔවුහු නොදන්නා බවත් ඔබ පවසන්න(අන්නම්ල්: 65)

- ජීවත් කරවීම, මරණයට පත් කිරීම හා අළුතින් නිර්මාණය කිරීම යනාදී විෂයන් කෙරෙහි අල්ලාහ් හැර අන් අයෙකුට ශක්තිය ඇති බව හා අල්ලාහ් හැර අන් අයෙකුට විශ්වය හැසිරවීමට හැකි බව විශ්වාස කරන උදවින්.පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

නැතහොත් මොවුහු අල්ලාහ්ට සමාන අය සිතින් මවා ගත්තෝ ද? ඔවුහු අල්ලාහ් නිර්මාණය කළා සේ නිර්මාණය කර ඒ හේතුවෙන් නිර්මාණය කළේ කවරෙක් දැයි මොවුනට පටලැවිල්ලක් ඇති වූයේ ද ? සියලු දෑහි නිර්මාණකරු අල්ලාහ් ය.ඔහු ඒක්කෙනා ය .මෙල්ල කොට පාලනය කරන්නා යැ යි ඔබ පවසන්න.(අර්රඃද්: 16)

- මුස්ලිම්වරුන්ට එරෙහිව ප්‍රතික්ෂේප කළ අය ළබැඳි මිත්‍රයින් ලෙස ගැනීම. අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

නුඹලා අතුරින් යම් කෙනෙක් ඔවුන් ආරක්ෂකයින් ලෙස ගන්නේ ද ඔහු ඔවුන්ට අයත් කෙනෙක් ය. අල්ලාහ් අපරාධ කරන පිරිසට මග නොපෙන්වයි. (අල්මාඉදා: 51)

- කවරෙකු හට හෝ ඉස්ලාම් දහම අවබෝධ කර ගැනිමේ හැකියාව හිමි වී එය ඕනෑකමින් මග හැර දමන්නේ නම් ඔහුද කාෆිර්වරයෙකු මෙන් සලකනු ලබයි. මන්දයත් ඔහුගේ අනවබෝධය ශූන්‍ය කර දමන සාධක ඔහු සතුව තිබුණද ඔහු එය ප්‍රතික්ෂේප කළ හේතුවෙනි.මුෂ්රික්වරුන් හෙවත් සමානයන් උපකල්පනය කරන අයවලුන් පිළිබඳ අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

නමුත් ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් සත්‍යය නොදනිති. ඔවුහු පිටු පාන්නෝ වෙති.(අල්න්බියා: 24)

මෙම අල්කුර්ආන් වැකියෙහි අල්ලාහ් එම සමානයන් උපකල්පනය කරන අයගේ අනවබෝධය කෙසේද යන්න පැහැදිලි කර ඉන් පසු එම අනවබෝධයට හේතු සාධක වූ පිටු පෑම හා ප්‍රතික්ෂේපය කෙසේද යන්න පැහිදිලි කරයි.තවද මෙසේ සඳහන් කරයිඃ

ප්‍රතික්ෂේප කරන අය තමන්ට අවවාද කරන ලද දැයට පිටු පාමින් සිටිති.(අහ්කාෆ්ඃ 3)

යම් සත්‍යය දෙයක් සඳහා සවන් දෙන අවස්ථාවෙදී එය ප්‍රතික්ෂේප කර එහි විස්තරාත්මක කරුණු පිළිබඳ අනවබෝධයෙන් පසු වීම යනු නිදහසට කරුණක් නොවේ.සෑම ජන සමාජයකම නොමග යෑම පිහිටා ඇත්තේ මෙම විෂය තුළයි.කෙසේදයත් ඔවුන් යම් සත්‍ය විෂයක කොටසක් සඳහා පමණක් සවන් දී එහි විස්තරාත්මක කරුණු පිළිබඳ උනන්දු නොවී ඒවා ප්‍රතික්ෂේප කරමින් සිටිති.

විශ්වයේ ඇති සාධකයන් කෙරෙහි අවධානය යොමු නොකිරීම යනු දේව ප්‍රතික්ෂේපකයින්ගේ ගති ගුණකි. ඒ පිළිබඳ අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයිඃ

අහස්හි ද පොළොවෙහි ද කොපමණ සාධක තිබේ ද? ඔවුහු ඒවා නොසලකා හරිමින් ම ඒවා පසු කර යති.(යූසුෆ්ඃ 105)

තවද මෙසේ ප්‍රකාශ කරයිඃ

නමුත් අපි ඔවුනට ඔවුන්ගේ උපදේශය පිරිනමා ඇත්තෙමු. ඔවුහු තම උපදේශයට පිටු පාමින් සිටිති.(අල්මුඃමිනූන්ඃ 71)

පොදුවේ ගත් කල මිනිසුන් අතර පවතින කුමන හෝ අයිතිවාසිකමක් පිළිබඳ අල්ප අවබෝධයක් තිබුණු කලද ඒවා උල්ලංඝනය කරනු ලැබූ කල්හි ඔහුට දඬුවමක් හිමි වේ නම් අල්ලාහ්ගේ විෂයෙහි එය කෙතරම් බැරෑරුම්ද යන්න ඉතා පැහැදිලිය.මිනිසාගේ බුද්ධිය සත්‍ය හඟවන සාධකයන් හා ආධාරයන් ඉදිරියේ කල්පණාකාරී නොවුනේ නම් එම සාධකයන්හි සැබෑ අරමුණු හා හරයන් ඔහුගෙන් මගහැරෙනු ඇත. ඉන් පසු අහස තරම් ප්‍රමාණයට පැහිදිලි සාධකයන් ඉදිරිපත් කළද එයින් කිසිදු ප්‍රයෝජනයක් බලාපොරොත්තු විය නොහැක.පාරිශුද්ධ අල්කුර්ආනයේ ඒ පිළිබඳ මෙසේ සඳහන් වේඃ

අහස සුරක්ෂිත වහලක් කළෙමු. නමුත් ඔවුහු එහි සාධක වලට පිටු පාමින් සිටිති. (අල් අන්බියාඃ 32)

සත්‍ය දහමක තොරතුරු විස්තරාත්මක ලෙස අවබෝධ නොකර ඒවා පිටු පෑමෙන් කිසිදු විපාකයක් සිදු නොවන බව ඇතැම් විට මිනිසා වැරදි ලෙස වටහා ගනී.මෙසේ පැහැදිලි සාධක තිබුණද මිනිසා සත්‍යය පිටු පා යෑමට හේතුව කුමක්ද යන්න විමසා බැලූ

*කලි එයට හේතුව ලෙස ප්‍රකාශනය වනුයේ ඔහුගේ අහංකාරකම හෝ උඩඟුකම හෝ විනෝදයයි. කිසියම් හෝ බලවත් ව්‍යසනයක් ඔහුට සිදු වූ පසු ඔහුගේ එම උඩඟු කම හා විනෝදය අත් හැර දමා එම සත්‍ය වෙත පිවිසෙන්නේ ඒ හේතුවෙනි.*

# පස්වන පාඩම

## ප්‍රකාශනය, ක්‍රියාව හා චේතනාව යන සංකල්ප තුනම ඊමාන් හෙවත් දේව විශ්වාසය තුළ අඩංගු විය යුතුයි.

*ඒ සඳහා රක්අත් තුනකින් සමන්විත මග්‍රිබ් සලාතය උදාහරණයක් ලෙස දැක්විය හැක. එහි එක් රක්අතයක් අඩු වූ කල්හි එයට මග්‍රිබ් සලාතය යනුවෙන් කියනු නොලැබෙන්නේ කෙසේද එසේම දේව විශ්වාසයේ අඩංගු විය යුතු කරුණු තුනින් එක් කරුණක් නැති වුවද එයට දේව විශ්වාසය යනුවෙන් කියනු නොලැබේ.*

*දේව විශ්වාසයේ අඩංගු විය යුතු කරුණු තුනෙහි යථාර්ථය වන්නේ මුහම්මද් (සල්)තුමාගේ ධර්මය සඳහා පමණක් විශේෂණ වූ ඇතැම් කරුණු කාරණා වේ.ඒ හැර මිනිසෙකුට යහපත පැතීම හා බොරු වංචා නොකර සිටීම යනාදී කරුණු දේව විශ්වාසය හා සම්බන්ධ මූලික කරුණු නොවේ.කුමක් නිසාදයත් මෙවන් සදාචාරය හා සම්බන්ධ කරුණු වෙත දේව විශ්වාසයක් නොමැති අදේවවාදීන්ගේ සිත් පවා ඇදී යනු ඇත.එසේනම් එයින් අදහස් වන්නේ සිතෙහි ප්‍රබල බලපෑමක් ඇති කරවන ප්‍රකාශනය හා ක්‍රියාවයි.*

*සිතෙහි බලපෑමක් ඇති කරවන ප්‍රකාශනය යනුවෙන් අදහස් කරනු ලබන්නේ නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැති බව හා මුහම්මද්(සල්)තුමාණන් අල්ලාහ්ගේ ධර්ම දූතයා බව හා ඔහු සර්ව බලධාරී අල්ලාහ්ගෙන් රැගෙන ආ දහම පමණි සත්‍ය දහම බව ස්ථිර ලෙස තහවුරු කිරීමයි.*

*සිතෙහි බලපෑමක් ඇති කරවන ක්‍රියාව යන්නෙන් අදහස් කරනු ලබන්නේ අල්ලාහ්, ඔහුගේ ධර්ම දූතයා හා ඉස්ලාම් දහම යනාදී සංකල්ප ආදරය කිරීමයි.තවද අල්ලාහ් හා ඔහුගේ ධර්ම දූතයා ප්‍රිය කරන දෑ ආදරය කිරීම වන අතර වන්දනාමානයේදී අවංක ලෙස හා චිත්ත පාරිශුද්ධියෙන් කටයුතු කිරීම වේ.*

*ඊමාන් හෙවත් විශ්වාසයේ අඩංගු විය යුතු වැදගත් සංකල්පය වන ප්‍රකාශනය යනු කතා කිරීමේදී සත්‍ය කතා කිරීම,දෙමාපියන් සමග කරුණාවෙන් කථා කිරීම වැනි පොදු යහපත් ශිලාචාර වචන තුළ පමණක් සීමා වන්නේ නැත. කුමක් නිසාදයත් අල්ලාහ්ව ප්‍රතික්ෂේප කරන උදවියද මෙවන් යහපත් විෂයන් කෙරෙහි ඇල්මෙන් පසුවෙති. එසේ*

නම් එයින් අදහස් වනුයේ මුහම්මද් (සල්)තුමාණන්ගේ දේව පණිවුඩය මගින් සුවිශේෂ වූ කරුණු කාරණාවන් වේ.එම කරුණු කාරණා වලින් ෂහාදා කලිමාව පැවසීම,අල්ලාහ්ව සුවි ශුද්ධ කිරීම යනාදී කරුණු සඳහා උසස් ස්ථානයක් හිමි වේ.

විශ්වාසයේ අඩංගු විය යුතු අනෙකුත් සංකල්පය වන ක්‍රියාව යනු දෙමාපියන්ට උපහාර කිරීම, මාර්ගය අවහිර කරන දෑ ඉවත දැමීම, දුගී දුප්පතුන්ට ආහාර පාන සැපයීම වැනි පොදු යහපත් ක්‍රියාවන් තුළ පමණක් සීමා වන්නේ නැත.කුමක් නිසාදයත් ඉහත කී පරිදි අල්ලාහ්ව ප්‍රතික්ෂේප කරන සිත් සතුවද මෙම විෂයන් කෙරෙහි ආශාවක් හා ඇල්මක් තිබේ.එසේ නම් එයින් අදහස් වනුයේ සලාතය,දුගී බද්ද,උපවාසය,හජ් කර්තව්‍ය වැනි මුහම්මද් (සල්)තුමාණන්ගේ දේව පණිවිඩය මගින් සුවිශේෂ වූ කරුණු වේ.

මිනිසාට යහපත අපේක්ෂා කිරීම,සත්‍ය ප්‍රකාශ කිරීම,දෙමාපියන් හට උපහාර කිරීම,දුගී දුප්පතුන්ට ආහාර සැපයීම, මාර්ගය අවහිර කරන දෑ ඉවත දැමීම වැනි යහපත් ක්‍රියාවන් යනු සාමාන්‍ය මිනිසා තුළ සහජව පිහිටා ඇති අතර මෙලොවට පහල කළ දහම් සියල්ලෙහිද ඒවා මිශ්‍රව දක්නට තිබේ. තවද එම සත් ක්‍රියාවන් අවංකව චිත්ත පාරිශුද්ධියෙන් ක්‍රියාවට නැංවීම තුලින් දේව විශ්වාසයේ වර්ධනයක් ඇති වේ.එනමුත් ඒවා ක්‍රියාවට නොගැනීම තුලින් දේව විශ්වාසයට කිසිදු බලපෑමක් සිදු නොවෙනු ඇති අතර දේව විශ්වාසය තිබෙන බව තහවුරු කිරීම සඳහා මිනුම් දණ්ඩයක් ලෙස ඒවා සලකනු නොලබයි.

එම සත් ක්‍රියාවන් තුලින් හඟවනු ලබන්නේ හුදෙක් මිනිසා සතුව සහජ බුද්ධියක් තිබෙන බව හා මානව හිතවාදය වෙනස් නොවී ජීවමානව තිබෙනු ඇති බවයි.මෙම සහජ බුද්ධිය සත්‍ය දහම පිළිගැනීමට ඉතා නැඹුරුය. ඒ පිළිබඳ මෙසේ පාරිශුද්ධ අල්කුර්ආනයේ සඳහන් වේ:

මෙය අල්ලාහ්ගේ ස්වභාවික ධර්මයයි. මෙය මත ම අල්ලාහ් මිනිසුන් පිහිටුවා ඇත. (අර්රූම්: 30)

## දේව විශ්වාසයේ ඇතැම් විට වර්ධනයක් හා අඩු වීමක් සිදු වනු ඇත.තවද ඇතැම් විට එය සම්පූර්ණයෙන් ශූන්‍ය වී යනු ඇත.

අල්ලාහ්ට අවනත වීම තුලින් එම දේව විශ්වාසය වර්ධනය වේ.අල්ලාහ්ට අකීකරු වී පාපයන් සිදු කිරීම තුලින් දේව විශ්වාසය තුළ හිඟයක් ඇති වේ.එම දේව විශ්වාසය සම්පූර්ණ ලෙස ශිර්ක් හෙවත් ආදේශ කිරීම හෝ කුෆ්ර් හෙවත් දේව ප්‍රතික්ෂේපය මගින් ශූන්‍ය වී යනු ඇත.පාරිශුද්ධ අල්කුර්ආනයේ ඒ පිළිබඳ මෙසේ සඳහන් වේ:

විශ්වාස කළ අය කවරෙකුද යත් අල්ලාහ් ගැන ඔවුනට ප්‍රකාශ කරනු ලබන විට ඔවුන්ගේ සිත් බියෙන් වෙවුලයි.ඔහුගේ වැකි ඔවුනට ප්‍රකාශ කරනු ලබන විට එය ඔවුන්ගේ විශ්වාසය වැඩි කරවයි.ඔවුහු තම දෙවියන් කෙරෙහි ම රඳා පවතියි.(අල් අන්ෆාල්: 02)

තවද මෙසේ සඳහන් වේ:

විශ්වාස කළ අය විශ්වාසය වැඩි කර ගනු පිණිසත්.... (අල්මුද්දස්සිර්: 31)

තවද මෙසේ සඳහන් වේ:

තම විශ්වාසය සමග තව තවත් විශ්වාසය වැඩි කරනු පිණිස විශ්වාස කළ අයගේ සිත්හි ශාන්තභාවය පහළ කළේ ඔහු ය.අහස් හා පොළොවෙහි සේනා අල්ලාහ්ට ම හිමිය.අල්ලාහ් සර්වඥයෙක් ද ප්‍රඥාවන්තයෙක් ද වේ. (අල්ෆත්හ්: 4)

## සාරාංශය

දේව විශ්වාසය සත්‍ය ලෙස තහවුරු කිරීම සඳහා පහත සඳහන් කරුණු ඒ තුළ අඩංගු විය යුතුයි:

- සිතෙන් විශ්වාස කිරීම.එය කරුණු දෙකකින් සමන්විතයි.ඒවා නම්:
  1: සිතෙහි ප්‍රකාශනය: එනම් සිතෙන් දේව පණිවුඩයෙහි සත්‍යතාවය තහවුරු කිරීම.
  2: සිතෙහි ක්‍රියාව: අල්ලාහ්ට හා ඔහුගේ ධර්ම දූතයාට ආදරය කිරීම හා ඔවුහු ප්‍රිය කරන දෑ ආදරය කිරීම.
- මුවෙන් ප්‍රකාශ කිරීම.
- කයෙන් ක්‍රියාවට නැංවීම.

ඒ අනුව කවරෙකු තම සිතෙහි දේව විශ්වාසයෙහි සත්‍යතාවය තහවුරු කර එය ප්‍රකාශ කිරීමට ශක්තිය ඇති විටද එය ප්‍රකාශ නොකළේ නම් ඔහු දේව විශ්වාසය කළ අයෙකු නොවේ.එසේම දේව විශ්වාසය තම සිතෙන් තහවුරු කර මුවින් පවසා ක්‍රියාවෙන් සනාථ කිරීමට ශක්තිය ඇතත් එය ක්‍රියාවෙන් සනාථ නොකළේ නම් ඔහුද දේව විශ්වාස කළ අයෙකු නොවේ.එනමුත් කෙනෙකු සඳහා දේව විශ්වාසය ප්‍රකාශ කිරීමේ හෝ එය ක්‍රියාවෙන් සනාථ කිරීමේ අභිමතය තිබුණද කුමන හෝ බලවත් හේතුවක් මත එය තහවුරු කිරීමට ශක්තිය නැතිනම් ඔහු පිළිබඳ අල්කුර්ආනයේ අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

කිසිවෙකු ඔහුගේ ශක්තියට අනුව මිස අල්ලාහ් දුෂ්කරතාවට පත් නොකරයි. (අල්බකරා: 286)

තවද මෙසේ පවසයි:

අල්ලාහ් කවරක් පිරිනමා තිබෙන්නේ ද එයට වඩා කිසිවෙක් දුෂ්කරතාවට පත් නොකරයි. (අත්තලාක්: 7)

දේව විශ්වාසයයෙහි අන්තර්ගත විය යුතු කරුණු තුනින් එක් කරුණක් නිශ්ප්‍රභ කරන යම්කිසි විෂයක් මුස්ලිම්වරයෙකු විසින් සිදු වූයේ නම් ඔහුගේ විශ්වාසය සම්පූර්ණයෙන් ශූන්‍ය වී යනු ඇත.කුමක් නිසාදයත් ඊමාන් යනුවෙන් පවසනු ලබන්නේ ඉහත සඳහන් මෙම සංකල්පයන් තුන මිශ්‍ර වූ සම්පූර්ණ විශ්වාසයක් සඳහායි.ඒවා මග්‍රිබ් සලාතයේ ඇති රක්අත් තුන හා සමාන වේ යනුවෙන් ඉහත පවසන ලදී. උදාහරණයක් ලෙස එම මග්‍රිබ් සලාතය ඉටු කරන්නා විසින් සලාතය අවලංගු කරන යම්කිසි විෂයක් රක්අත් තුනෙන් එක් රක්අතයක පමණක් සිදු කළද ඔහුගේ සම්පූර්ණ සලාතයම අවලංගු වනු ඇත. ඊමාන් හෙවත් දේව විශ්වාසයේ අන්තර්ගත විය යුතු සංකල්ප තුනෙහි තත්වයද මේ හා සමාන වේ.

මෙසේ දේව විශ්වාසයෙහි අන්තර්ගත විය යුතු කරුණු තුනින් එක් කරුණක් නිශ්ප්‍රභ කරන යම්කිසි විෂයක් මුස්ලිම්වරයෙකු විසින් සිදු වූයේ නම් ඔහුගේ විශ්වාසය සම්පූර්ණයෙන් ශූන්‍ය වී යනු ඇතැයි ප්‍රකාශ කිරීම මඟින් දේව විශ්වාසයේ වර්ධනයක් හෝ හිගයක් ඇති නොවේ යන්න අදහස් නොකෙරේ. කෙසේදයත් සලාතය අවලංගු වන හුදෙක් එක් විෂයක් සලාතයේදී සිදු කිරීම මඟින් සලාතය අවලංගු වේ යැයි අප දනිමු.එනමුත් සාමන්‍ය සලාතයකදී සම්පූර්ණ දේව භක්තියෙන් හා දීර්ඝ ලෙස සිට ගෙන සලාතය කිරීම,අල්කුර්ආනය පාරායනය කිරීම යනාදී විෂයන් මඟින් එම සලාතයේ තරාතිරම වා එහි වලංගු භාවය ශක්තිමත් වන අතර ඉහළ බැලීම,සුජූද් හි සුනඛයෙකු මෙන් දෑත් විහිදුවා තබා ගැනීම යනාදී දෑ හුදෙක් සලාතයෙහි වලංගු භාවයෙහි තරාතිරම අඩු කරන අතර සලාතය සම්පූර්ණ ලෙස අවලංගු නොකරයි. ඊමාන් හෙවත් දේව විශ්වාසයේ තත්වයද මේ හා සමාන වේ.

එසේම විශ්වාසය හා සලාතය නිශ්ප්‍රභ කරන ක්‍රියාවක් යැයි සලකනු ලබන්නේ අල්ලාහ් හා ඔහුගේ ධර්ම දූතයා එම ක්‍රියාව විශ්වාසය හා සලාතය නිශ්ප්‍රභ කරන ක්‍රියාවක් යැයි නිර්නය කළා නම් පමණි.ඒ හැර අන්කිසිවක් සලාතය හා විශ්වාසය නිශ්ප්‍රභ කරන ක්‍රියාවන් යැයි පැවසිය නොහැක.

# හයවන පාඩම

## සර්ව බලධාරී අල්ලාහ්ට උසස් ගුණාංග හා අලංකාරමත් නාමයන් තිබේ.

ඔහු පිළිබඳ ඔහු හැර අන් කිසිවෙකු දැන ගත නොහැක. එබැවින් අල්ලාහ් පාරිශුද්ධ අල්කුර්ආනය හා නබි (සල්) තුමාණන්ගේ මග පෙන්වීම් මගින් ඔහුට නොතිබෙන බව ප්‍රකාශ කර තිබෙන ගුණාංග සියල්ල ඔහුට නොතිබෙන බව විශ්වාස කළ යුතු අතර ඔහුට තිබෙන බව පැවසූ ගුණාංග සියල්ල ඔහුට තිබෙන බව තහවුරු කළ යුතුයි.

සර්ව බලධාරී අල්ලාහ් අසම්පූර්ණතාව හා දුර්වලතාවයෙන් තොර වූ කෙනෙකු බව අප පිළිගත යුතුයි. ඔහුට නොසුදුසු එකී දුර්වලතාවයන් විස්තරාත්මක ලෙස ගෙන හැර දක්වා ප්‍රතික්ෂේප කිරීමට අවශ්‍ය නැත. පොදුවේ සෑම දුර්වල ගති ලක්ෂණ වලින් ඔහු සුවිශුද්ධයි යනුවෙන් විශ්වාස කිරීම ප්‍රමාණවත් වේ.එනමුත් ඔහු සතුව තිබෙන ගති ගුණාංග පිළිැනීමේදී සෑම ගුණාංගයක්ම විස්තරාත්මක ලෙස පිළිගත යුතුයි.එම ගුණාංග අනෙකුත් වස්තුවක ගුණාංග සමග සැසඳීම හෝ තත්වාරෝපණය කිරීම හෝ උපමා කිරීම තහනම් වේ.එනමුත්, අල්ලාහ්ට නුසුදුසු කුමන දුර්වලතාවයන් විස්තරාත්මක ලෙස ප්‍රතික්ෂේපයට ලක් වී තිබේද ඒවා විස්තරාත්මක ලෙස ප්‍රතික්ෂේප කළ යුතුයි.

උදාහරණයක් ලෙස පාරිශුද්ධ අල්කුර්ආනයේ අල්ලාහ් තමා හට බිරින්දෑවරුන් හා ළමුන් නොමැති බව පවසයි.(මෙහිදී අල්ලාහ්ට නුසුදුසු කරුණක් විස්තරාත්මක ලෙස ප්‍රතික්ෂේප වී ඇත.)එසේම යුදෙව්වන් සර්ව බලධාරී අල්ලාහ් ලෝභයෙකු යනුවෙන් පැවසූ විට එම නුසුදුසු ගුණාංගය තමන්ගෙන් අල්ලාහ් බැහැර කර ඇත.ඒහා සම්බන්ධ අල්කුර්ආන් වැකි පහත දැක්වේ:

- ඔහුට භාර්යාවක් නොමැතිව සිටිය දී ඔහුට දරුවෙකු සිටිය හැක්කේ කෙසේ ද? (අල්අන්ආම්: 101)
- ඔහු දාව උපන්නේද නැත. දරුවන් වදන්නේද නැත.(ඉඛ්ලාස්: 03)
- අල්ලාහ්ගේ අත බැඳිනු ලැබ ඇතැ'යි යුදෙව්වරු පවසති. බැඳිනු ලැබ ඇත්තේ ඔවුන්ගේ අත් ම ය.ඔවුන්ගේ මෙම ප්‍රකාශය හේතු කොට ගෙන ඔවුහු ශාප කරනු

ලැබූහ.එසේ නොවේ. ඔහුගේ දෑත් විහිද ඇත.(අල්මාඉදා: 64)

අල්ලාහ්ගේ අලංකාර නාමයන් හා උසස් ගුණාංග පිළිබඳ වහී හෙවත් දිව්‍යමය හෙළිදරව්ව තුළ කුමන ආකාරයෙන් සඳහන් වි තිබේද එකී ආකාරයෙන්ම ඒවා විශ්වාස කළ යුතුය. තවද එහි යථාර්ථය අප විසින් තහවුරු කිරීමේදී ඇතැම් විට එහි ඉඟියන් අපට ග්‍රහණය කළ හැකි නමුත් එහි සීමාව ඉක්මවා යෑමෙන් වැළකී සිටිය යුතුයි. මන්දයත් අල්ලාහ්ට සමාන කිසිවක් හෝ කිසිවෙක් නොමැත.පාරිශුද්ධ අල්කුර්ආනයේ අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

ඔහු මෙන් කිසිවක් නැත.ඔහු සවන් දෙන්නා යත බලන්නා ය.(අෂ්ෂූරා: 11)

## අල්ලාහ්ගේ ගුණාංගයන් අතුරින් කිසිවක් වෙනත් වස්තුවක් සමඟ සංසන්දනය නොකළ යුතුයි.

මන්දයත් සංසන්දනය කිරීම සඳහා කුමන හෝ මූලික විෂයක් හා අතිරේක විෂයක් තිබිය යුතුය.එනමුත් අල්ලාහ් එසේ නොවේ.ඔහු ඒකීයයි.ඔහුට සමාන කිසිවෙකු නොමැත.ඔහුට සමීප කළ හැකි කිසිදු අතිරේක විෂයක් හෝ ඔහුට වඩා උසස් මූලික විෂයක් භවයේ නොමැත. මන්දයත් අල්ලාහ් අවශ්‍යතා වලින් තොර වූ කෙනෙකි.ඔහු දාව උපන්නේද නැත.ඔහු දරුවන් වදන්නේද නැත.එසේම ඔහුට සමානව කිසිවෙක් හෝ කිසිවක් නැත.

මිනිසාගේ බුද්ධිය හා මනස යනු යම් දෙයක් නරඹා එයට සවන් දීම තුලින් සංසන්දනය කළ හැකි උපකරණයක් මෙන් අල්ලාහ් නිර්මාණය කර ඇත.අල්ලාහ් තමන් පිළබඳ කරන ප්‍රකාශ සවන් දීමට පමණක් හැකි අතර එය කිසිදා දැක ගත නොහැක. බුද්ධිය හා මනස මගින් අල්ලාහ්ගේ ගුණාංග හා නාමයන් සසඳා බැලිය නොහැකි වන්නේ මේ හේතුවෙනි.එවන් වූ බුද්ධියක ඔහු පිළිබඳ යම් කිසි සුදුසු නොමැති උපමාවක් ග්‍රහණය වූ හේතුවෙන් ස්ථිර ලෙස තහවුරු වූ ගුණාංගයක් හෝ නාමයක් ප්‍රතික්ෂේප කිරීමට අවශ්‍ය නැත. එබැවින් බුද්ධියෙහි හා මනසෙහි ඇති වන අල්ලාහ්ට සුදුසු නොමැති ගුණාංගයන් අප ප්‍රතික්ෂේප කර අල්ලාහ් විසින් ප්‍රකාශිත ගුණාංගයන් හා නාමයන් තහවුරු කර එයින් අප ප්‍රමාණවත් විය යුතුයි.පාරිශුද්ධ අල්කුර්ආනයේ අල්ලාහ් මෙසේ පවසයි:

ඔවුන් ඉදිරියෙහි තිබෙන දෑය ගැන ද ඔවුන් පිටු පස තිබෙන දෑය ගැන ද ඔහු (අල්ලාහ්) දනියි. ඔවුහු ඔහු ගැන සහමුලින් ම දැන නොගනිති.(තාහා: 110)

තවද මෙසේ පවසයි:

දෘෂ්ටියන් ඔහු ග්‍රහණය නොකරයි. නමුත් ඔහු සියලු දෘෂ්ටියන් ග්‍රහණය කරයි. ඔහු තීක්ෂණ බුද්ධිමතා ය , ප්‍රවීණයා ය.(අන්ආම්: 103)

## අති උතුම් වූ අල්ලාහ් ඔහුගේ ගෞරවයට අනුව අහස් හතට ඉහළින් ඇති ඔහුගේ අර්ෂ් ( සිංහාසනයේ) විරාජමානව වැඩ සිටී.

ඒ පිළිබඳ පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

ඔහු පළමු වැන්නා ය,අන්තිමයා ය, ප්‍රත්‍යක්ෂව සිටින්නා ය, ගුප්ත ව සිටින්නා ය, ඔහු සියලු දේ ගැන සර්වඥයෙකි. අහස් ද පොළොව ද දින හයකින් නිර්මාණය කළේ ඔහු ය. පසුව අර්ෂ් මත රැඳී සිටීය. පොළොවෙහි ඇතුළු වන දැයත් එයින් බැහැර වන දැයත් අහසින් පහළ වන දැයත් එහි නැග යන දැයත් ඔහු දනියි.නුඹලා කොහි සිටියත් ඔහු නුඹලා සමග සිටියි .අල්ලාහ් නුඹලා කරන දේ බලන්නෙකි .(අල්හදීද්: 3/4)

ඔහු අර්ෂය මත සිටින බව හා එසේ සිටියද ඔහුට සියලු දේ පිළිබඳ ඥානය තිබෙන බව මෙම වැකිය තහවුරු කරයි.තවද තම මැවීම් සමගම ඔවුන් පවසන සියලු දෑට සවන් දෙමින්, ඔවුන්ගේ ක්‍රියාවන් දෙස බලමින් හා ඔහුගේ ස්නේහයට ලක් වූවන් සඳහා උදවු උපකාර කරමින් සිටියි. ඒ පිළිබඳ පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

නුඹලා කොහි සිටියත් ඔහු නුඹලා සමග සිටියි.(අල්හදීද්: 04)

මූසා හා හාරූන් (අලෙයිහිස්සලාම්) තුමාණන් දෙස බලා අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

බිය නොවන්න ! මම බලමින් ද අසමින් ද ඔබ දෙදෙනා සමග සිටිමි' යි(දෙවියන්) පැවසී ය.(තාහා: 46)

විෂයන් සියල්ල කෙරෙහි පූර්ණ අභිමතය අල්ලාහ් සතුය. ඔහු කුමන දෙයක් සිතන්නේද එය සිදු වේ. ඔහු නොසිතූ දෙයක් සිදු වන්නේ නැත.එම ගුණාංගය අල්ලාහ් තහවුරු කළ ආකාරයට අප තහවුරු කළ යුතුයි.තාර්කික වාදීන් මෙන් එම විෂයෙහි ගැඹුරු ලෙස අධ්‍යනය කිරීමට අවශ්‍ය නැත.අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

“මෙලෙස ය” අල්ලාහ් තමා සිතූ දේ කරන්නේ යැයි පැවසීය.(ආලුඉම්රාන්: 40)

තවද:

අර්ෂ්හි හිමියා යන මහානුභාව සම්පන්නයා ය.සිතන දෙයක් සිදු කරන්නා ය. (අල්බුරූජ්: 15/16)

ඒ අනුව වහී හෙවත් දිව්‍යමය හෙළිදරව්ව මගින් තහවුරු වූ ගුණාංග හා නාමයන් පමණක් අප ස්ථිර ලෙස තහවුරු කළ යුතු අතර ඒවා හැර අනෙකුත් සියල්ල පිළිබඳ (බුද්ධිය භාවිතා නොකර) අප ප්‍රමාණවයත් විය යුතුයි. අල්කුර්ආනය හා නබි (සල්) තුමාණන්ගේ මග පෙන්වීම් වල සඳහන් නොවූ අල්ලාහ්ට අදාල නොමැති ගුණාංග හා නාමයන් ඇතැම් අවස්ථාවන් වල විචාර බුද්ධිය මගින් තහවුරු කිරීමට හැකි වූයේ නම් ඒවාද අල්ලාහ්ට අදාල නොවේ යැයි විශ්වාස කර ඒවායින් ඔහුව සුවිශුද්ධ කළ යුතුයි.උදාහරණයක් ලෙස දුකට පත් වීම, ඇඬීම හා කුසගින්න යනාදී ගුණාංග අල්ලාහ්ට නැති බව අල්කුර්ආනයේ හා අල් හදීස් වල සඳහන් වූයේ නැත.එනමුත් අප බුද්ධිය අල්ලාහ්ට එම ගුණාංග සුදුසු නැති බව හඟවයි .ඒ අනුව අල්කුර්ආනයේ හා අල්හදීස් වල එම ගුණාංග පිළිබඳ තොරතුරු නොතිබුණද ඒවා අප විසින් අල්ලාහ්ට සුදුසු නොමැති ගුණාංග යැයි විශ්වාස කළ යුතුයි.

# හත්වන පාඩම

## අල්කුර්ආනය යනු සර්ව බලධාරී අල්ලාහ් සම්භාෂණය කළ වදන් වේ.

එහි අන්තරගත වී තිබෙන වාක්‍යයන්, පරිච්ඡේදයන් හා අක්ෂර සියල්ල හුදෙක් ඔහු පමණක් සැබෑ ලෙස සම්භාෂණය කළ ඒවා වේ.එසේ නොමැතිව ඔහු වෙනුවෙන් වෙනත් කෙනෙකු වාර්තා කළ වදන් පෙළකි යනුවෙන් විශ්වාස කිරීම වැරදිය. තවද ඔහුගේ අභිමතයට අනුව ඔහු සම්භාෂණය කරනු ඇත යනුවෙන් විශ්වාස කළ යුතුයි.

- අල්ලාහ්ගේ සම්භාෂණය පිළිබඳ පාරිශුද්ධ අල්කුර්නයේ මෙසේ සඳහන් වේ:

  1) අල්ලාහ් මූසා සමග සැබවින් ම සම්භාෂණය කළේය.(අන්නිසා: 164)

  2) අපි පොරොන්දු වූ ස්ථානයට මූසා පැමිණ ඔහු සමග ඔහුගේ දෙවියන් සම්භාෂණය කළ විට.. (අල්අඃරාෆ්: 143)

  මේවා හැර අල්ලාහ්ගේ සම්භාෂණය පිළිබඳ හඟවන නොයෙකුත් අල්කුර්ආන් වැකි රාශියක් තිබේ.

- ඔහු සත්‍යය කතා කරන්නෙකි.

  ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ.

  අල්ලාහ් සත්‍යය පවසයි. (අහ්සාබ්: 4)

- ඔහුගේ වදන් මිනිසුන්ගේ සිත් තුළ ආරක්ෂා කරනු ලබයි.

  ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ.

  නමුත් මේවා පැහැදිලි වැකි වේ. අධ්‍යාපනය දෙන ලද අයගේ සිත් තුළ පවතී. (අන්කබූත්: 49)

- කන් වලින් සවන් දෙනු ලබන්නේ ඔහුගේ වදන්ය.

  ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ.

සමානයන් කල්පනය කරන අයගෙන් යම් කෙනෙක් ඔබගෙන් රැකවරණයක් පතන්නේ නම් ඔහු අල්ලාහ්ගේ වචන වලට සවන් දෙනු පිණිස ඔහුට රැකවරණය සලසන්න.(අත්තව්බාඃ 06)

ජනයින් ඉදිරියේ අල්ලාහ්ගේ වදන් ප්‍රකාශයට පත් කරන තැනැත්තා නබි(සල්) තුමාණන් වුවද එය අල්ලාහ්ගේ වදනකි යන රාමුවෙන් බැහැර යන්නේ නැත.

- ඔහුගේ වදන් රේඛාවන් තුළ ලිඛිතව ඇත.

ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ.

දිග හරින ලද ලේඛනයෙහි ලිඛිත පුස්තකය මත දිවුරමි.(තූර්ඃ 2/3)

- ඔහුගේ වදන් සුරක්ෂිත පුවරුවෙහි ආරක්ෂාකාරීව තිබේ.

ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ.

එසේ ය. මෙය ඉමහත් කුර්ආනයකි.සුරක්ෂිත පුවරුවෙහි ඇත.(බුරූජ්ඃ 21/22)

තවද මෙසේ සඳහන් වේ.

මෙය අප වෙත තිබෙන මාතෘ ලේඛනයෙහි ඇත.මෙය උත්කෘෂ්ට ය. ප්‍රඥාවෙන් පිරිපුන් ය. (සුහ්රුෆ්ඃ 4)

ලිඛිතව තිබීම හේතුවෙන් වදන යන රාමුවෙන් අල්ලාහ්ගේ වදන් බැහැර යන්නේ නැත. කඩදාසිය හා තීන්ත යනු අල්ලාහ්ගේ මැවීම් අතුරින් එක් මැවීමකි. එසේ තිබුණද අල්ලාහ්ගේ වදන් මැවිම් අතුරින් එක් මැවීමක් නොවෙනු ඇත.එයට සාක්ෂියක් ලෙස පහත අල්කුර්ආන් වැකිය ඉදිරිපත් කළ හැක.

(මුහම්මද්) කඩදාසියෙහි ලියන ලද ධර්ම ග්‍රන්ථයක් අපි ඔබට පහළ කළේ නම්.... (අන්ආම්ඃ 7)

මෙම වාක්‍යයෙහි කඩදාසිය වෙනම හා ධර්ම ග්‍රන්ථය වෙනමද සඳහන් වී ඇත.එමගින් ඒ දෙකම වෙනස් බව පැහැදිලි වේ.

අල්ලාහ්ගේ නිර්මාණයක් වන තීන්ත හා පෑන් උපයෝගී කරමින් පාරිශුද්ධ අල්කුර්ආනය ලියවී තිබුණද එය අල්ලාහ්ගේ වදනකි යන්න තහවුරු කරමින් මෙසේ එහි සඳහන් වේ.

පොළොවෙහි තිබෙන සියලු ගස් කොලන් සියල්ල පෑන් බවටද සාගරය සමග තවත් සාගර හතක් (තීන්ත වී) පිහිටවූවත් අල්ලාහ්ගේ නියෝග ලියා නිම කළ නොහැකිය.(ලුක්මාන්ඃ 27)

*තවද මෙසේ සඳහන් වේ.*

*මාගේ දෙවියන්ගේ නියෝග(ලිවීම) සඳහා මුහුද තීන්ත බවට පත් වූව ද මාගේ දෙවියන්ගේ නියෝග (ලියා) නිම කිරීමට පෙර මුහුද සිඳී යනු ඇත.(කහ්ෆ්: 109)*

*අල්ලාහ්ගේ වදන් අතුරින් පෑන් මගින් ලිය වුනු හා ලිය නොවුනු සියල්ලක්ම ඔහුගේ වදන් වේ.කවරෙකු අල්ලාහ්ගේ සම්භාෂණාව මවන ලැබූ නිර්මාණයකි යනුවෙන් පවසන්නේද ඔහු කාෆිර් හෙවත් දේව ප්‍රතික්ෂේප කරුවෙකි. මන්දයත් අල්ලාහ්ගේ සම්භාෂණාව යනු ඔහුගේ ගුණාංග හා සම්බන්ධ විෂයකි. සර්ව බලධාරී අල්ලාහ් ඔහුගේ මැවීම් වලට හා ඔහුගේ සම්භාෂයන් අතර තිබෙන වෙනස මෙසේ පැහැදිලි කරයි:*

*අහස් හා පොළොව දින හයකින් නිර්මාණය කළේ නුඹලාගේ දෙවියන් වන අල්ලාහ් ම ය. ඉන් පසු ඔහු අර්ෂය මත අසුන් ගත්තේ ය. ඔහු රාත්‍රිය දවාලෙන් ආවරණය කරයි .දහවල,රාත්‍රිය පසුපස වේගයෙන් හඹා යයි. ඔහු සූර්යයා ද චන්ද්‍රයා ද තාරකා ද තම නියෝගයෙන් අවනත කරවීය.දැන ගන්න ! නිර්මාණය ද නියෝගය ද ඔහුට ම හිමිය. විශ්වයේ දෙවියන් වන අල්ලාහ් භාග්‍යවන්තයෙකි.(අඃරාෆ්: 54)*

*මෙම අල්කුර්ආන් වැකියෙහි අල්ලාහ් තම නිර්මාණයන් වන අහස, පොළව ,ඉර,හඳ ,තාරකා යනාදී වස්තූන් හා ඔහුගේ( නියෝගයෙන් අවනත කරවීය යන තම) නියෝගය යන කරුණු දෙක බෙදා වෙන් කර පවසමින් ඒ අතර තිබෙන වෙනස පැහැදිලි කරයි.*

*අල්කුර්ආනය පාරායනය කරන උදවියන්ගේ ශබ්දය නිර්මාණය කළේ අල්ලාහ්ය.කෙසේදයත් එය පාරයනය කරන තැනැත්තාගේ තොල් දෙක ,දිව හා උගුර යන අංග අවයවයන් නිර්මාණය කළේ ඔහුය.ඒ අනුව ඒවා උපයෝගි කරමින් පිට වන ශබ්දයද අල්ලාහ්ගේ නිර්මාණයකි යන්න නිසැකයි.කෙසේ වෙතත් අප සවන් දෙන අල්කුර්ආනය අල්ලාහ්ගේ සම්භාෂනාවක් නොවන බව මෙයින් අදහස් වන්නේ නැත.පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:*

*ඔවුන්ගෙන් පිරිසක් අල්ලාහ්ගේ වැකි වලට සවන් දෙනු ඇත: (අල්බකරා: 75)*

*එසේනම් සවන් දීමට ලක් වන දෑ එය පාරායනා කරන්නාගේ මුවෙන් පිට වූව ද ඒවා අල්ලාහ්ගේ වදන් වේ.ඒ පිළිබඳ ඇතැම් විද්වත්හු මෙසේ පවසති:*

*ශබ්දය පාරයනය කරන්නාගේ ශබ්දය වේ. වදන අල්ලාහ්ගේ සම්භාෂණාව වේ.*

# අටවෙනි පාඩම

## ඉස්ලාමීය ෂරීආවෙහි යථාර්තයන් ග්‍රහණය කළ හැකි වන්නේ: වහී (දිව්‍යමය හෙළිදරව්ව) හා මිනිසාගේ බුද්ධි ගෝචරය යන සංකල්ප දෙක මගිනි.

බුද්ධියක් නොමැති පුද්ගලයෙකුට දිව්‍යමය හෙළිදරව්ව මගින් කිසිදු ඵලක් නෙලා ගත නොහැකි වන අතර දිව්‍යමය හෙළිදරව්ව පිළිබඳ අවබෝධයක් නොමැති හුදෙක් බුද්ධියටද(ඉස්ලාමය හා සම්බන්ධ කරුණු පිළිබඳ) කිසිදු ඵලක් නෙලා ගත නොහැකි වේ.එම සංකල්පයන් දෙකින් එක් සංකල්පයක් නැති වී යාම තුලින් මිනිසා සැබෑ යථාර්තය අවබෝධ කර ගැනීමට අපොහොසත් වනු ඇත.

කුමන හෝ අවස්ථාවක, බාහිරව එම සංකල්පයන් අතර එක්තරා ආකරයක භේදයක් හෝ විරුද්ධත්වයක් තිබෙන බව පෙනුනද,බුද්ධියට වඩා(වහී)දිව්‍යමය හෙළිදරව්ව සඳහා ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ. මන්දයත් දිව්‍යමය හෙළිදරව්ව යනු සර්ව සම්පූර්ණ ගුණාංග යන් ඇති නිර්මාපකයා වන අල්ලාහ්ගේ පූර්ණ ඥානය වන අතර බුද්ධිය යනු අසම්පූර්ණ ගුණාංගයන් පිරි නිර්මාණයක් වන මිනිසාගේ ඥානයයි.

බුද්ධි ගෝචරය යනු යම් දෙයක් නැරඹීම හා සමාන වන අතර දිව්‍යමය හෙළිදරව්ව යනු ආලෝකය හා සමාන වේ. අන්ධකාරයේ රැඳී සිට යම් වස්තුවක් දෙස නෙත යොමු කළේ නම් කිසිවක් නරඹන්නට නොහැකි වන්නේ කෙසේද, එසේම දිව්‍යමය හෙළිදරව් පිළිබඳ අවබෝධයක් නොමැති නුවණැත්තෙකු මගින්ද කිසිදු ඵලක් නෙලා ගල නොහැක. නෙත යොමු කර යමක් නැරඹිය හැකි වන්නේ ආලෝකය පවතින ප්‍රමාණයටයි. එසේම දිව්‍යමය හෙළිදරව්ව පිළිබඳ තිබෙන අවබෝධයෙහි ප්‍රමාණයට අනුව මිනිසාගේ බුද්ධි ගෝචරය නිවැරදි මාවතෙහි යොමු වේ. හිරු සම්පූර්ණයෙන් උදා වී ඇති මධ්‍යහන වේලාවේදී වස්තුවක් දෙස ඉතා පැහැදිලිව සම්පූර්ණ ලෙස නැරඹිය හැකි වන්නේ කෙසේද එසේම දිව්‍යමය හෙළිදරව්ව පිළිබඳ තිබෙන අවබෝධය හා බුද්ධි ගෝචරය එකට මිශ්‍ර වී සම්පූර්ණ වීම තුලින් යහමග හා පරමාර්ථය සම්පූර්ණයෙන් පැහැදිලි වේ.පාරිශුද්ධ අල්කුර්ආනයේ අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

- විශ්වාස කළවුන්ගේ භාරකරු අල්ලාහ් ය. ඔහු ඔවුන් අන්ධකාරයන්ගෙන් ආලෝකය කරා බැහැර කරන්නේය. තව ද ප්‍රතික්ෂේප කළවුන් වන ඔවුන්ගේ භාරකරුවන් නපුරු බලවේගයන් ය . ඔවුහු ඔවුන් ව ආලෝකයෙන් අන්ධකාරයන් කරා බැහැර කරන්නෝය.(අල්බකරා: 257)

මෙම අල්කුර්ආන් වැකියෙහි (අල්ලාහ් බැහැර කරන්නේය යනුවෙන්) භාවිතා වී ඇත. මන්දයත් ඔහුගේ පිහිට හා ආශිර්වාදය නොමැති නම් විශ්වාස කළවුන් අන්ධකාරයෙහි පසුවන්නට තිබුණි.

ගින්න හා ආලෝකය යන දෙකෙහිම වර්ග විවිධ වුවද,ආලෝකය යනුවෙන් සැලකීමේදී එය එක් මාධ්‍යයක් ලෙස සැලකෙන්නේ කෙසේද අල්කුර්ආනය හා නබි(සල්)තුමාගේ මග පෙන්වීම් යන දෙකම විවිධ වුවද ඒවා වහී හෙවත් දිව්‍යමය හෙළිදරව්ව තුළ ඒකරාශී වේ. පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

- විශ්වාස කළ අයවලුනි, අල්ලාහ්ට හා දූතයාට(මුහම්මද්ට) ද අවනත වන්න. (අන්නිසා: 59)

මා හට දිව්‍යමය හෙළිදරව්ව අවශ්‍ය නොවේ. හුදෙක් මාගේ බුද්ධියෙන් පමණක් යහමගට යොමු විය හැකි බව කවරෙකු හෝ ප්‍රකාශ කළේ නම් එම ප්‍රකාශය ආලෝකයක් නොමැතිව පියවි ඇසින් පමණක් අන්ධකාරයේ ගමන් කළ හැකි බව ප්‍රකාශ කිරීම හා සමාන වේ.සර්ව බලධාරී අල්ලාහ් තම දිව්‍යමය හෙළිදරව්ව සෑම නිර්මාණයක් සඳහා යහමග පෙන්නුම් කරන එක් ආලෝකයකි යනුවෙන් පවසයි:

- විශ්වාස කොට මොහුට ගෞරව කර මොහුට උදව් කර මොහු සමග පහළ කරන ලද ආලෝකය ද අනුගමනය කරන්නෝ ජය ලද්දෝ ය. (අඃරාෆ්: 157)

ධර්ම දූතයින් හා ඔවුන්ගේ අනුගාමිකයින් සඳහා මග පෙන්වන්නේද එම ආලෝකයයි.එබැවින් අල්ලාහ්ගේ අණ පනත් හා ඔහු විසින් තහනම් කළ සෑම කරුණක් ඉදිරියේම අප යටහත් පහත් වී ජීවත් විය යුතුයි. යමක් අනුමත කිරීමේ හෝ තහනම් කිරීමේ හේතුව අප අවබෝධ කළද නැතහොත් අවබෝධ කිරීමට නොහැකි වුවද ඒවා විශ්වාස කර භාර ගත යුතුයි. බුද්ධි ගෝචරය මගින් ග්‍රහණය කළ හැකි සියුම් කරුණු පවා වටහා ගන්නට නොහැකිව තිබියේදී බුද්ධි ගෝචරයෙන් ග්‍රහණය කළ නොහැකි විෂයක් වටහා ගත හැක්කේ කෙසේද යන්න මදක් සිතා බැලිය යුතුයි.

මා විශ්වාස කරන්නේ බුද්ධි ගෝචරයට ග්‍රහණය වූ විෂයන් පමණි. බුද්ධි ගෝචරයෙන් ග්‍රහණය කළ නොහැකි විෂයක් මා විශ්වාස නොකරමි යනුවෙන් කවරෙකු හෝ වාද

*කරන්නේ නම් නියත වශයෙන්ම මොහු දිව්‍යමය හෙළිදරව්වට වඩා බුද්ධියට ප්‍රමුඛත්වය ලබා දෙන පුද්ගලයෙකු වේ.පොදුවේ බුද්ධි ගෝචරයෙන් ග්‍රහණය කළ නොහැකි විෂයන් ප්‍රතික්ෂේප කිරීම හෝ ඒවා මිත්‍යාවකි යනුවෙන් කෙනෙකුට කිව නොහැක.ඇතැම් විට එකී විෂය බහුට පමණක් වටහා ගත නොහැකි විෂයක් වන්නට පුළුවණි. දෙනෙතින් නැරඹිය හැකි සීමාවක් තිබෙන්නේ කෙසේද එසේම බුද්ධිය සඳහාද ග්‍රහණය කළ හැකි ප්‍රමාණයක් හා සීමාවක් ඇත.තම දෙනෙත මඟින් දැක ගත හැකි සීමාව විශ්වයේ අවසානය යනුවෙන් තීරණය කළ නොහැක. එසේම කනට සවන් දිය හැකි සීමාවක් ඇත.තවද මිනිසාට සවන් දිය නොහැකි ශබ්දයක් වෙත කුහුඹියෙකුට සවන් දිය හැක.එමෙන්ම විශ්වයේ පියවී ඇසින් දැක ගත නොහැකි තාරුකාවන් හා ග්‍රහලෝක රාශියක් ඇත.එසේ නම් මෙමඟින් පෙනී යන්නේ මිනිසාට ග්‍රහණය කළ නොහැකි විෂයක් ,විශ්වයේ නැති බව ප්‍රතික්ෂේප කළ නොහැක යන්නයි.*

# නමවන පාඩම

## ආගමෙහි පූර්ණ අයිතිය තිබෙන්නේ අල්ලාහ් සතුවයි.

යම් දෙයක් අනුමත කිරීම හා යම් දෙයක් තහනම් කිරීම යනාදී දෑ සිදු වන්නේ ඔහුගේ අභිමතයට අනුවයි.සර්ව බලධාරී අල්ලාහ් ධාර්මික හා ලෞකික විෂයන්හි යහපත රැදා පැවතීම සඳහා මෙම නීති සම්පාදනය මෙලොවට පහළ කළහ.එහෙයින් යම් නීතියක වලංගු භාවය අහෝසි කළ හැක්කේ ඔහුට පමණි.ඔහුගේ අනුමැතියෙන් තොරව කිසිදු නිතියක් සංශෝදනය කළ නොහැක.

සර්වබලධාරී අල්ලාහ් විසින් ධර්මානුගත කළ ලෞකික හා ධාර්මික සෑම නීතියක්ම එක හා සමානය.එහි කිසිදු වෙනසක් නොමැත.ධාර්මික නීති සඳහා උදාහරණ නම්: සලාතය,උපවාසය,හජ් කර්තව්‍ය,මස්ජිදයන් ඉදි කිරීම යනාදී ඒවා වේ.ලෞකික නීති සඳහා උදාහරණ නම්: ව්‍යාපාරය, විවාහය,දික් කසාද වැනි කරුණු හා සම්බන්ධ නීති වේ.

කවරෙකු හෝ මෙම ධාර්මික හා ලෞකික නීති මාලා අතර වෙනසක් ඇති කිරීමට තැත් කරන්නේද උදාහරණයක් ලෙස ධාර්මික නීති සම්පාදනය අල්ලාහ්ට අයත් බව හා ලෞකික නිති සම්පාදනය ඔහු හැර අනෙකාට අයත් යැයි පවසන්නේ නම් ඔහු කාෆිර් වරයෙකු ලෙස සලකනු ලැබේ.මන්දයත් දහමෙහි සියලු අංශයකම හිමි කරු අල්ලාහ් වේ.ඔහු හැර අන් අයෙකුට එහි හිමිකාරත්වය ලබා දීම යනු සුජූද් නම් වන්දනාව අල්ලාහ් හැර අන් අයෙකුට කළ හැකි යැයි ප්‍රකාශ කිරීම හා සමාන වේ.පාරිශුද්ධ අල්කුර්ආනයේ උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

- බලය අල්ලාහ්ට මිස අන් කිසිවෙකුට නැත. ඔහු හැර අන් කිසිවකට නැමදුම් නොකළ යුතු යැයි ඔහු අණ කර ඇත.(යූසුෆ්: 40)

මෙසේ නීතී සම්පාදනය කිරීමේ හිමිකාරත්වය යනු ඉශ්‍රාඊල්වරුන් ඔවුන්ගේ පාදලිවරුන් හා පූජකවරුන් හට ලබා දීම හේතුවෙන් ඔවුහු කාෆිර් වරුන් වූ බව අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

- ඔවුහු අල්ලාහ් හැර තම ධර්මාචාර්යවරුන් ද පාදිලිවරුන් ද මර්යම්ගේ පුත් මසීහ් ව ද දෙවිවරුන් ලෙස ගත්හ.නමුත් ඔවුනට අණ කරන ලද්දේ එකම දෙවියකුට නැමදුම් කරන ලෙස ය.ඔහු හැර නැමදීමට සුදුස්සා වෙනත් කිසිවෙක් නොමැත.ඔවුන් කල්පනය කරන සමානයන් කෙරෙන් ඔහු සුවිශුද්ධවන්තයා ය.(තව්බා: 31)

මෙම අල්කුර්ආන් වැකියෙහි ඔවුන් කළ එම ක්‍රියාව ශිර්ක් හෙවත් ආදේශයක් යනුවෙන් අල්ලාහ් පැහැදිලිවම ප්‍රකාශ කර ඇත.

පාරිශුද්ධ අල්කුර්ආනය පහළ කර ඉස්ලාම් දහමෙහි නීති සම්පාදනය කළේ අල්ලාහ්ය.අනාගතයේ සිදු වීමට හැකි සිදුවීම් හා අතීතයේ සිදු වුණු සිදුවීම් පිළිබඳ එසේම වර්තමානයේ සිදු වෙමින් පවතින දෑ දකිමින් හා ඒ පිළිබඳ මනා අවබෝධයකින්ද ඔහු පසු වේ.එසේනම් මෙයින් අතීත කාල, වර්තමාන කාල ,අනාගත කාල හා ගුප්ත හා ප්‍රත්‍යක්ෂ යනාදී විෂයන් පිළිබඳ ඔහු ඉදිරියේ කිසිදු වෙනසක් නැත යනුවෙන් මනා පැහැදිලි වේ.

අනාගතයේ හෝ අතීතයේ සිදු වූ සිදුවීමක් එය අනාගතයේ හෝ අතීතයේ සිදු වූ හේතුවෙන් එකී විෂය පිළිබඳ ඔහුගේ ඥානයේ කිසිදු අඩුකමක් සිදු නොවේ.තවද වර්තමානයේ සිදු වන සිදුවීමක් එය වර්තමානයේ සිදු වන හේතුවෙන් එකී විෂය පිළිබඳ කිසිදු ඥානයක් ඔහු තුළ වර්ධනය වන්නේද නැත.සෑම කාලයකම සිදු වන සිදුවීම් පිළිබඳ එකහා සමාන ඥානයකින් ඔහු පසු වේ.එබැවින් ඔහු හැර නීති සම්පාදනය කිරීමේ හිමිකාරත්වයට අදාල අන් කිසිවෙකු නොමැත යන්නට මෙය ඉතා ප්‍රමාණවත් ය.

කවරෙකු හෝ අල්ලාහ්ගේ නීතිය එම නීතිය පහළ වූ කාල වකවානුව පමණක් සීමා කර ඉන් පසුව පැමිණෙන පරම්පරාව සඳහා ඔවුන් යහපත් ලෙස සිතන සියල්ලක්ම (අල්ලාහ්ගේ නීතියට පටහැනිව තිබුණද) ඒවා නීති ගත කිරීමට හැකි යැයි සිතන්නේ නම් මොහු කාෆිර් හෙවත් දේව ප්‍රතික්ෂේප කරුවෙකි.

ලෞකික ජීවිතයේ මිනිසා තම බුද්ධිය මගින් ගුප්ත හා ප්‍රත්‍යක්ෂ විෂයන් අතර සැබෑවින්ම වෙනසක් ඇති බව වටහා ගනී.එබැවින් එම වෙනසට අනුව යම් ස්වභාවික නීතීන්ද ඔහු වෙනස් කරයි.එනමුත් අල්ලාහ්ගේ නීති විෂයෙහි එසේ සිදු කරන්නට නොහැක.එසේ අල්ලාහ්ගේ නීතියද ඔහු වෙනස් කරන්නේ නම් ඉහත කී පරිදි ඔහුට කාෆිර් යැයි කියනු ලැබේ.

පුද්ගලයෙකු අල්ලාහ්ගේ නීතියද කාලයෙන් කාලයට වෙනස් කළ හැකි යනුවෙන් සිතා තම බුද්ධිය විසින් තීන්දු කළ නීතියට ප්‍රමුඛත්වයක් ලබා දෙන්නේ නම් මෙය ශිර්ක් හෙවත් ආදේශයක් හා කුෆ්ර් හෙවත් දේව ප්‍රතික්ෂේපයකි යන්න නිසැකයි.අල්ලාහ්ගේ ඥානය ඉදිරියේ අතීත කාලය, අනාගත කාලය හා ගුප්ත හා ප්‍රත්‍යක්ෂ යනාදී දෑ එකහා සමාන වේ.අල්ලාහ් මෙසේ පවසයි:

- ඔහු ගුප්ත දෑහි ද ප්‍රත්‍යක්ෂ දෑහි ද සර්වඥයෙකි. ඔවුන් කල්පනය කරන සමානයන් කෙරෙන් ඔහු උත්කෘෂ්ට ය.(මුඃමිනූන්: 92)

  පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

- අහෝ අල්ලාහ් ! අහස් හා පොළොවේ නිර්මාපකයාණෙනි,ගුප්ත හා ප්‍රත්‍යක්ෂ දැය

ගැන සර්වඥයාණෙනි ! ඔබේ වහලුන් ප්‍රතිවිරුද්ධ වූ දෑහි ඔවුනතර ඔබ ම විනිශ්චය කරනු මැනවැ'යි පවසන්න.(සුමර්: 46)

සෑම කාල වකවානුවකම ජීවත් වන ඔහුගේ ගැත්තන් සඳහා නීති සම්පාදනය කිරීමේ බලය හා ශක්තිය සර්වබලධාරී අල්ලාහ් සතුය.

අල්ලාහ්ගේ ධාර්මික නීති හා ලෞකික නීති අතර කවරෙකු හෝ වෙනසක් ඇති කිරීමට තැත් කළේ නම් තවද ධාර්මික විෂයන්හි නීති සම්පාදනය කිරීමේ බලය අල්ලාහ්ට හා ලෞකික ජීවිතය හා සම්බන්ධ නිතී සම්පාදනය කිරීමේ බලය අන් අයෙකුට ලබා දෙන්නේ නම් මෙමගින් විවිධ නීති සම්පාදකයින් රාශියක් සිටින බව ඔහු තහවුරු කරයි. මෙය වර්තමානයේ ලිබරල් වාදීන්ගේ මත වාදයට සමාන වේ.ඉස්ලාම් ආගමෙහි නීති සම්පාදනය කිරීමේ බලය තිබෙන්නේ අල්ලාහ්ට පමණි.ඒ පිළිබඳ අල්ලාහ් මෙසේ පවසයි:

ධර්ම ග්‍රන්ථයෙහි කොටසක් විශ්වාස කොට තවත් කොටස් ප්‍රතික්ෂේප කරන්නෙහු ද ?(බකරා: 85)

ඒ අනුව කවර පුද්ගලයෙකු ඉස්ලාම් දහමෙහි කොටසක් ප්‍රතික්ෂේප කරන්නේද ඔහු එහි මුලු කොටසම ප්‍රතික්ෂේප කළා හා සමාන වේ.අල්ලාහ් මුහම්මද්(සල්)තුමාණන් හට පහල කළ දේ අනුව ජනයින් අතර විනිශ්චය කරන ලෙස අන කර සිටියි.

ඔබ අල්ලාහ් පහල කළ දේ අනුව ඔවුනතර විනිශ්චය කරන්න. ඔවුන්ගේ චිත්තාභිලාෂයන් අනුගමනය නොකරන්න.අල්ලාහ් ඔබට පහල කළ දැයෙහි ඇතැම් දැයින් ඔවුන් ඔබ අවුල් කළ හැකිය.ඒ පිළිබඳ අවධානයෙන් යුතුව සිටින්න. (මාඉදා: 49)

වහී හෙවත් දිව්‍යමය හෙළිදරව්ව කුමන විෂයන් පිළිබඳ විස්තර නොකළේද ඉස්ලාමීය විද්වතුන් විසින් ඒ කරුණු පිළිබඳ සමීක්ෂණය කර නිශ්චිත තීන්දුවක් ලබා දීමට අනුමැතිය ඇත.එනමුත් එම නීතිය පෙරාතුව තහවුරු වූ අල්ලාහ්ගේ යම් නීතියකට විරුද්ධ වන පරිදි හෝ උල්ලංඝනය වන පරිදි නොතිබිය යුතුයි.

අල්ලාහ්ගේ නීතියට පටහැනිව ජනයින් විසින් ගනු ලබන නීතියක් හෝ තේරීමක් සඳහා ප්‍රමුඛත්වයක් ඉස්ලාම් දහම තුළ දෙනු නොලබයි.මේ ආකාරයෙන් ජනයින්ගේ නීතිය හා තේරීම සඳහා ප්‍රමුඛත්වයත් ඉස්ලාම් දහම තුළ තිබුණේ නම් ධර්ම දූතයින් අතුරින් අධික පිරිසක් සත්‍යයෙන් බැහැරව කටයුතු කළ පිරිසක් මෙන් පත්වන්නට තිබුණි.මන්දයත් ඔවුන් තම ධර්මය ප්‍රචාරය කිරීමේදී එකල්හි වැජඹූ සමාජයෙන් බහුතරයක් ඔවුනට පටහැනිව කටයුතු කළ අතර එම අවස්ථාවේදී එම ධර්ම දූතයින් බහුතර ජනයාගේ මතයට කිසිදා ප්‍රමුඛත්වයක් ලබා නොදුන්හ.ඔවුන් ප්‍රමුඛත්වය ලබා දුන්නේ අල්ලාහ්ට හා ඔහුගේ නීතියටයි.

සර්ව බලධාරී අල්ලාහ්ගේ නීතියට ගෞරවය කිරීම පිණිස හා එම නීතියට අවනත වීම පිණිස ඉස්ලාමීය පෙර කාලීන ඇතැම් විද්වතුන් තම ඉස්ලාමීය ප්‍රතිපත්ති පිළිබඳ ග්‍රන්ථ වල ඉස්ලාම්

දහමෙහි ප්‍රතිපත්ති නොවන විවිධ අතිරේක නිතීන් ස්වල්පයක් ඇතුළත් කර ඇත.මන්දයත් ඒවා ඉස්ලාම් දහම තුළ තිබුණද නොයෙකුත් නිකායන් හා මත වාදීන් මඟින් ඒවා උල්ලංඝනයට හා නවීකරණයට භාජනය වී ඇත.එම අතිරේක නීති සමහරක් පහත දැක්වේ:

- වුළු කිරීමේදී කුෆ් හෙවත් සමෙන් සාදන ලද පාවහන් මත තෙත් අතින් පිසදා ගැනීමේ නීතිය.
- ගමනේදී සලාතය කෙටි කර ඉටු කිරීමේ නීතිය.
- යහපත් හෝ අයහපත් පාලකයෙකු සමඟ(අවශ්‍ය නම්) ජිහාදය නම් ධර්ම යුද්ධයට සහභාගි වීමේ නීතිය.

ඉහත සඳහන් නීතීන්ට අමතරව කාලයෙන් කාලයට පැමිණි විවිධ නිකායන්හි අභිමතයට අනුව නවීකරණයට භාජනය වූ වෙනත් විශේෂ නීතීන් සමහරක්ද තිබේ. ඒවා පහත ආකාරයෙනි:

- කාන්තාවගේ හිජාබ් වස්ත්‍රය ඉබාදත් හෙවත් වන්දනාවට අයත් වූවකි.එය සාම්ප්‍රදායික ලෙස පැවති චාරිත්‍ර වාරිත්‍රයක් නොවේ.
- කාන්තා පිරිමි මිශ්‍රය තහනම් යන නීතිය.
- මුස්ලිම්වරයෙකු සඳහා කාෆිර්වරයෙකු (වලී) භාරකත්වය නොදරයි.
- දේපළ උරුම බෙදා දීමේදී පුත්‍රයාට හිමි වන කොටස් ප්‍රමාණයෙන් අඩක් දියණියට හිමි වේ යන නීතිය.
- කාන්තාවක් ඝාතනය කිරීමට ලක් වුයේ නම් ඇය සඳහා හිම වන වන්දිය පිරිමයෙකු සඳහා හිමි වන වන්දියෙන් අඩකි යන නීතිය. (ඝාතනයක් සිදු වුයේ නම් එහි දී ගනු ලබන දියත් හෙවත් වන්දිය යනු ආත්මයක වටිනාකම නොවේ.එය දෙනු ලබන්නේ හුදෙක් ඝාතනය කිරීමට ලක් වූ පුද්ගලයාගේ පවුලෙහි නඩත්තුව හා සිත් සෑහිමක් සඳහා පමණි.)
- විවාහ වූ තැනැත්තෙකු දුරාචාරයේ නියැලුනේ නම් ඔහු සඳහා හිමි වන ගල් ගසා ඝාතනය කිරීමේ දඬුවම අල්ලාහ්ගේ නීතියකි.

ඉහත සඳහන් අතිරේක ඉස්ලාමීය නීතීන් නීතිගත කිරීමේ හේතුව හා හරය කුමක්ද යන්න අවබෝධ කළද නොකළද ඒවා සියල්ල පිළිගත යුතුයි.

# දහවන පාඩම

## විශ්වයේ නිර්මාණයන් සියල්ල මැවීමට පෙර අල්ලාහ් ඒවායෙහි විස්තර සියල්ල නිර්ණය කර හමාරය.

*ඒ අනුව යම් වස්තුවක් මවනු ලබන්නේ එහි නිර්ණය කළ දෛවය සමඟිනි . අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි.:*

*ඔහු සියලු දේ නිර්මාණය කළේය.එය සැලසුම් සහගතව පිහිටුවීය. (ෆුර්කාන්: 02)*

*තවද මෙසේ සඳහන් කරයි:*

*අපි සියලූ දේ ප්‍රමාණිකව නිර්මාණය කර ඇත්තෙමු. (කමර්: 49)*

*තවද මෙසේ සඳහන් කරයි:*

*අල්ලාහ්ගේ අණ තීරණය කරන ලද තීන්දුවක් වේ. (අහ්සාබ්: 38)*

*යහපත් හා අයහපත් සිදුවීම් සියල්ල සිදු වන්නේ එකී අල්ලාහ්ගේ දෛවයට හා පෙර දැනුමට අනුවයි. සහීහ් මුස්ලිම් ග්‍රන්ථයේ උමර් (රළි) තුමා විසින් නබි (සල්) තුමා ප්‍රකාශ කළ බව මෙසේ සඳහන් වේ:*

*"යහපත් හා අයහපත් සිදු වීම් සිදුවන්නේ දෛවයෙනි යනුවෙන් ඔබ විශ්වාස කළ යුතුයි"*

*තමා විසින් නිර්ණය කරනු ලබන විෂයන් කෙරෙහි අල්ලාහ් පරිපූර්ණ ඥානයෙන් පසු වේ. විෂයන් නිර්ණය කිරීමට නම් ඒ විෂයන්හි ආරම්භය හා අවසානය කෙසේද යන්න හා ඒවා සිදු වන ස්ථාන හා ඒවායෙහි ස්ථාවරයන් කුමක්ද යනාදී කරුණු පිළිබඳ පරිපූර්ණ ඥානය හා අවබෝධය තිබිය යුතුයි . ඒවා පිළිබඳ පරිපූර්ණ ඥානය තිබෙන්නේ ඒවායෙහි නිර්පාකයා වන අල්ලාහ්ට පමණි. පාරිශුද්ධ අල්කුර්ආනයේ අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:*

*අල්ලාහ් සියලූ දේ කෙරෙහි බලසම්පන්නයෙක් බවත් අල්ලාහ් සියලු දේ දැනුමෙන් වටලා ගෙන සිටින බවත් නුඹලා දැන ගනු පිණිස. (තලාක්: 12)*

තවද මෙසේ ප්‍රකාශ කරයිඃ

ඔහු නිර්මාපකයා දැන නොගන්නේ ද? ඔහු තීක්ෂණ බුද්ධිමතා ය.ප්‍රවීණයා ය. (මුල්ක්ඃ 14)

අල්ලාහ්ගේ දෛවය ප්‍රතික්ෂේප කිරීම යනු අල්ලාහ්ගේ ඥානය ප්‍රතික්ෂේප කිරීම හා සමානයි.එසේම ඔහුගේ ඥානය ප්‍රතික්ෂේප කිරීම යනු ඔහුගේ දෛවය ප්‍රතික්ෂේප කිරීම හා සමානයි. අල්ලාහ් සෑම වස්තුවකම දෛවය එක් ලේඛනයක ලිඛිතව තබා ඇත. පාරිශුද්ධ අල්කුර්ආනයේ අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයිඃ

අපි එම පුස්තකයෙහි කිසිවක් අත් නොහැරියෙමු. (අන්ආම්ඃ 38)

තවද මෙසේ ප්‍රකාශ කරයිඃ

සියලු දේ පැහැදිලි ලේඛනයෙහි නිශ්චය කර ඇත්තෙමු. (යාසීන්ඃ 12)

## අල්ලාහ්ගේ නිර්මාණයන් කොටස් දෙකකිඃ

- යම් දෙයක් තෝරා ගැනීමේ හැකියාවක් නොමැති ඉර, හඳ , තාරුකා වැනි නිර්මාණයන්.
- යම් දෙයක් තෝරා ගැනීමේ හා අපේක්ෂා කිරීමේ හැකියාව තිබෙන මිනිසුන්,ජින්වරුන් හා මලාඉකාවරුන් වැනි නිර්මාණයන් වේ.

අල්ලාහ් විසින් ඔවුන් කළමනාකරනය කරනු ලබන්නේ යම් දෙයක් තෝරා ගැනීමේ හැකියාව ඔවුනට ලබා දීමෙන් අනතුරුවයි . එසේ නොමැති නම් පාපයක් සිදු කිරීමට අල්ලාහ් විසින්ම බලපෑම් එල්ල කර ඒ සඳහා ඔහු විසින්ම දඬුවම නියම කිරීමට සිදු වේ. මෙය අසාධාරන ක්‍රියාවකි.මෙවැනි ගුණාංග වලින් අල්ලාහ් සුවිශුද්ධයි.

එසේම අල්ලාහ්ගේ කළමනාකාරත්වයෙන් තොරව ස්වාධීනව ඔවුනට යම් දෙයක් තෝරා ගැනීමේ පූර්ණ හැකියාවද ඔවුනට නැත.එසේ ස්වාධීනව තෝරා ගැනීමේ හැකියාව ඔවුනට තිබුණේ නම් ඔවුහු අල්ලාහ්ට එකී විෂයෙහි සමාන වනු ඇත.එසේනම් අල්ලාහ්ගේ අභිමතයට පහළින් ඔවුන්ගේ අභිමතය තිබේ යන්න අප වටහා ගත යුතුයි. එබැවින් අල්ලාහ්ගේ දෛවය සත්‍යයකි.සැබෑවකි. එහෙත් මිනිසාට ඕනෑම කාර්යයක් ස්වෙච්ඡාවෙන් තෝරා ගැනීමේ නිදහස ද එය ඉටු කිරීමේ හැකියාව ද අල්ලාහ් ලබා දී ඇත යනුවෙන් විශ්වාස කළ යුතුයි.පාරිශුද්ධ අල්කුර්ආනයේ අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයිඃ

මෙය ලෝවැසියනට ද නුඹලාගෙන් කවරෙකු ඍජුව කටයුතු කිරීමට ප්‍රිය කරන්නේ ද

ඔහුට ද අනුශාසනාවක් මිස වෙන නැත. විශ්වයේ දෙවියන් වන අල්ලාහ් සිතන දෑය මිස නුඹලා නොසිතන්නෙහු ය. (තක්වීර්: 27/29)

අල්ලාහ් විසින් ඔහුගේ වහලුන් හා ඔවුන්ගේ ක්‍රියාවන් සියල්ල නිර්මාණය කර ඇත.පාරිශුද්ධ අල්කුර්ආනයේ අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

"නුඹලා නෙළූ දෑය නුඹලා නමදින්නෙහු ද? අල්ලාහ් ම නුඹලා ද නුඹලා කරන දෑය ද නිර්මාණය කළේ යැ'යි පැවසීය. (සාෆ්ෆාත්: 95/96)

තවද යම් සිදු වීමක් සිදු වීම සඳහා හේතු සාධක හා ඒ හේතු සාධක සඳහා භාජනය වන මාධ්‍යයද අල්ලාහ්ම නිර්මාණය කර ඇත. ඒවා සියල්ල විශ්වය ඉතා සියුම් සැකසුමක් සමග ගමන් කිරීම සඳහා ඔහුගේ සියුම් ඥානයෙන් සිදු වූ විෂයන් වේ.

බාහිරව අල්ලාහ්ගේ යම් දෛවයක හේතුව හා හරය කුමක්ද යන්න අපැහැදිලි නිසාවෙන් එය ප්‍රතික්ෂේප කිරීම හෝ එයට විරුද්ධ වීම මුස්ලිම්වරයෙකුට සුදුසු නොමැති කරුණක.මන්දයත් පොදුවේ ගත් කළ බුද්ධියෙන් ග්‍රහණය කළ නොහැකි හේතූන් හා හරයන් රාශියක් මෙලොවෙහි ඇත.තවද බුද්ධිය යනු කුඩා භාජනයක් මෙනි.එනමුත් ඇතැම් හරයන් හා හේතූන් සාගරයක් මෙනි.ඒවා වටහා ගැනීමේ හැකියාව බුද්ධිය සතුව නොමැත. පියවි ඇසින් අධික ලෙස සූර්යයා දෙස බලා සිටීමෙන් ඇසට වේදනාවක් හා අවුල් සහගත තත්වයක් ඇති වන්නේ කෙසේද එසේම ඇතැම් හේතූන් හා හරයන් පිළිබඳ අධික ලෙස සිත යොමු කිරීම තුළින් අවුල් සහගත ස්ථාවරයන් ජීවිතයේ හට ගන්නට පුළුවනි.

# එකළොස්වන පාඩම

## මරණය යනු සත්‍යය සිදු වීමකි.

*පාරිශුද්ධ අල්කුර්ආනයේ අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:*

*මෙහි සිටින සියල්ලෝ ම විනාශ වන්නෝ වෙති. මහානුභාව සම්පන්න වූ ද ගෞරවනීය වූ ද ඔබේ දෙවියන්ගේ මුහුණ පමණක් ඉතිරි වන්නේ ය. (රහ්මාන්: 26/27)*

*මුස්ලිම්වරයෙකු විශ්වාස කළ යුතු කරුණු අතුරින් දිව්‍යමය හෙළිදරව්ව මගින් තහවුරු වූ සොහොන් වළෙහි වේදනාව හෝ එහි සතුට වැනි මරණයෙන් මතු සිදු වන සිදුවීම් පිළිබඳව විශ්වාසය කිරීමද එක් කරුණකි.ඒවායින් ස්වල්පයක් පහත දැක් වේ:*

- *මරණින් මතු නැවත නැගිටු වීම හා ලෝ වාසී සියල්ලන් ඒකරාශි කිරීම කෙරෙහි විශ්වාසය: ඒ පිළිබඳ උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:*

  *සූර් පිඹිනු ලැබේ.වහාම ඔවුහු සොහොන් වළ වලින් තම දෙවියන් වෙත වේගයෙන් ගමන් කරති. (යාසීන්: 51)*

  *මරණින් මතු සිදු වන සිදුවීම් කෙරෙහි සැක සිතීම කුෆ්ර් හෙවත් දේව ප්‍රතික්ෂේපයකි.ඒ පිළිබඳ ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:*

  *(එකම දෙවියන්) ප්‍රතික්ෂේප කළ අයට "නුඹලාට මාගේ වැකි ප්‍රකාශ කරනු ලැබුවේ නැද්ද? උඩඟු වී වැරදි කරන පිරිසක් වූයෙහු යැ'යි පවසනු ලැබේ. අල්ලාහ්ගේ පොරොන්දුව සැබෑය.යුගාන්ත මොහොතෙහි කිසිදු සැකයක් නැතැ'යි පවසනු ලබන විට යුගාන්ත මොහොත යනු කුමක් දැ'යි අපි නොදනිමු ,අපි අනුමාන කරන අය මිස වෙන නැත. අපි ස්ථිර ලෙස විශ්වාස කරන අය නොවෙමු'යි නුඹලා පැවසුවෙහු ය. (ජාසියහ්: 32/32)*

  *ඒ සිදුවීම් පිළිබඳ සැක සිතීම තුලින්ම කෙනෙකු කාෆිර්වරයෙකු වේ නම් ඒ සිදුවීම් මිත්‍යාවකි යනුවෙන් පවසා ඒවා ප්‍රතික්ෂේප කරන්නා නිසැකයෙන් කාෆිර්වරයෙකු වේ යන්න ඉතා පැහැදිලිය.අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:*

*නමුත් ඔවුහු යුගාන්ත මොහොත අසත්‍ය යැයි සිතූහ. යුගාන්ත මොහොත අසත්‍ය යැයි සිතන අයට අපි නිරයක් පිළියෙල කර ඇත්තෙමු. (ෆුර්කාන්: 11)*

- විනිශ්චය කිරීම කෙරෙහි විශ්වාසයද මුස්ලිම්වරයෙකු විශ්වාස කළ යුතු කරුණු අතුරින් එක් කරුණකි.උත්තරීතර අල්ලාහ් ඒ පිළිබඳ මෙසේ සඳහන් කරයි:

*අපි කියාමත් දිනය වෙනුවෙන් යුක්ති සහගත තුලාවන් ස්ථාපනය කරන්නෙමු.කිසිවෙකුට සුළුවෙන් හෝ අපරාධ කරනු නොලැබේ.අබ ඇටයක තරම් වූවත් එය ද ගෙන එන්නෙමු.ගණන් ගැනීමට අපි ම ප්‍රමාණවත් ය. (අන්බියා: 47)*

- කුලිය හා දඬුවම ලබා දීම,ස්වර්ගය හා නරකාදිය යනාදී කරුණු කෙරෙහි විශ්වාසයද මුස්ලිම්වරයෙකු විශ්වාස කළ යුතු කරුණු අතුරින් එක් කරුණකි.ඒ පිළිබඳ උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:

*අභාග්‍යවන්තයෝ නිරයෙහි සිටිති.ඔවුනට එහි කෙඳිරි ගැසීමක් ද හීල්ලීමක් ද ඇත. (හූද්: 106)*

*තවද:*

*භාග්‍යවන්තයෝ ස්වර්ගයෙහි සිටිති. (හූද්: 108)*

*දේව ප්‍රතික්ෂේපකරුවන් නරකාදියෙහි හා දේව විශ්වාසවන්තයින් ස්වර්ගයෙහිද සිටිනු ඇත.ඒ පිළිබඳ උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:*

*(මා)ප්‍රතික්ෂේප කළ අයට මෙලොවදීත් පරලොවදීත් දරුණු ලෙස දඬුවම් කරන්නෙමි.ඔවුනට කිසිදු පිහිට වන්නකු නොසිටිනු ඇත.විශ්වාස කොට යහපත් ක්‍රියා කරන්නන්ගේ කුලිය ඔවුනට සහමුලින් ම ඔහු පිරිනමයි.අල්ලාහ් අපරාධකරුවන් ප්‍රිය නොකරයි. (ආලුඉම්රාන්: 56/57)*

*මරණින් මතු ජීවිතය පිළබඳ අල්කුර්ආනයෙන් හා නබි(සල්) තුමාණන්ගේ මග පෙන්වීමෙන් තහවුරු වූ වාර්තා පොත,හව්ලුල් කව්සර් නම් පොකුණ,සිරාත් අල් මුස්තකීම් හෙවත් අපායට ඉහළින් තනා ඇති පාලම යනාදී සිදුවීම් සියල්ල විශ්වාස කිරීම මුස්ලිම්වරයෙකු සඳහා අනිවාර්ය වේ.*

# දොළොස්වන පාඩම

## අල්කුර්ආනය හා නබි (සල්) තුමාගේ මඟ පෙන්වීම් අනුගමනය කරන සමූහයක් සමඟ බැඳී සිටීම අනිවාර්ය වේ.

*එම සමූහය සඳහා නායකයෙක් සිටීම අවශ්‍ය වන අතර එම නායකයාට අවනත වීමද අනිවාර්ය වේ. උත්තරීතර අල්ලාහ් ඒ පිළිබඳ මෙසේ සඳහන් කරයි:*

*විශ්වාස කළ අයවලුනි! නුඹලා අල්ලාහ් සහ අවසාන දිනය ගැන විශ්වාස කළෙහු නම් අල්ලාහ්ට අවනත වන්න.මෙම දූතයාට (මුහම්මද්ට)ද අවනත වන්න.නුඹලා අතුරින් බලය තිබෙන අයට ද අවනත වන්න. (නිසා: 59)*

*(ඉස්ලාමීය පාලනයකදී) අල්ලාහ්ව ප්‍රතික්ෂේප කරන කාෆිර්වරයෙකු මුස්ලිම්වරුන්ගේ නායකයෙකු ලෙස පත් විය නොහැක.එම නායකයා සතුව ධර්මය පිළිබඳ අවබෝධයක් නොමැති නම් ඒ පිළිබඳ අවබෝධයකින් පෙළෙන විද්වතෙකු අනිවාර්යයෙන් ඔහු සමඟ සිටිය යුතුයි.එමඟින් ධාර්මික හා ලෞකික අවවාද අනුශාසනා ජනයින් වෙත ඉදිරිපත් කර ඔවුන් යහමඟ වෙත යොමු කළ හැකි වේ.පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:*

*ආරක්ෂාව නැතහොත් භීතිය ගැන පුවතක් ඔවුනට ලැබෙන විට එය පතුරුවා හරිති.එය මෙම දූතයා(මුහම්මද්) වෙත ද තමන් අතුරින් බලය තිබෙන අය වෙත ද රැගෙන ගොස් ඇත්නම් ඔවුන්ගෙන් පර්යේෂණය කරන්නෝ එය දැන ගනිති.අල්ලාහ්ගේ දයාව හා ඔහුගේ කරුණාව නුඹලා කෙරෙහි නොවූයේ නම් සුළු පිරිසක් හැර (අන්අය)ෂෙයිතාන්ව අනුගමනය කර සිටින්නෙහු ය. (නිසා: 83)*

*ඉස්ලාමීය සමූහයක් නියෝජනය කරන නායකයෙකුට එරෙහිව කටයුතු කිරීම ඉස්ලාම් දහමෙහි තහනම් වූ කරුණකි.ඔහු විසින් යම්කිසි ආකාරයකින් අසාධාරණ අයුරින් හිංසාවන් සිදු වේ නම් ඒවා විඳ දරා ඉවසමින් කටයුතු කළ යුතුයි.එනමුත් පැහැදිලි ලෙස ඉස්ලාම් දහමෙන් බැහැර කරවන ක්‍රියාවන් හා සම්බන්ධ යම්කිසි ක්‍රියාවක් ඔහු සිදු කළේ නම් ඔහුට එරෙහිව පෙළ ගැසීමෙන් කිසිදු වරදක් නැත.ඒ සඳහා තිබෙන සාධකය නම්:*

අල්ලාහ්ගේ දූතයාණන් ප්‍රකාශ කළ බව විශ්වාසවන්තයින්ගේ මව උම්මු සලමා හින්ද් බින්ත් අබී උමෙයියා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ වාර්තා කරන ලදී: (අනාගතයේ දී)ඔබලා අතර සමහර පාලකයින් පත් වෙති.විටක ඔවුන්ගේ යහපත ඔබලා දකිනු ඇත. විටක ඔවුන්ගේ අයහපත දකිනු ඇත.එවිට (ඔවුන්ගේ අයපත් දෑ) ඔබලා පිළිකුල් කරන්නෙහුය. ඔවුන්ගේ අසාධාරණ ක්‍රියාවන් කෙරෙහි (සිතෙන්) අකැමැත්තක් දක්වන තැනැත්තා නිර්දෝෂි විය.එම අසාධාරණ ක්‍රියාවන් කෙරෙහි (සිතෙන්)විරුද්ධවන තැනැත්තා විමුක්තිය ලබන්නේය.ඔවුන් කරන හැම ක්‍රියාවක්ම අනුමත කරමින් ඔවුන් අනුගමනය කරන අය හැර(එවැනි අය විමුක්තිය ලබන්නේ නැත.)එවිට එතුමාගේ සහගාමීහු අල්ලාහ්ගේ දූතයාණනි ! අප ඔවුන් සමඟ සටන් කළ හැකි දැ' යි විමසූහ.ඒ ඇසූ එතුමාණෝ නැත . ඔවුන් සලාතය නොවරදවා ඉටු කරන තාක් කල් සටන් නොකරන්නැ' යි ප්‍රකාශ කළහ.(මුස්ලිම්)

එම පාලකයා අධර්මිෂ්ඨ හා අයහපත් ලෙස කටයුතු කිරීමේදී එම අයහපත සහමුලින්ම සමාජයෙන් ඉවත් කිරීමට හෝ අවම කිරීමට ඔහුට අවවාද කළ හැකි වාතාවරනයකදී ප්‍රඥාවෙන් යුතුව ඔහුට අවවාද කළ යුතුයි.ඒ පිළිබඳ නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කර ඇත:

අල්ලාහ්ගේ දූතයාණන්(සල්) ප්‍රකාශ කළ බව තමීමුද් දාරී (රළියල්ලාහු අන්හු) විසින් දැනුම් දෙන ලදී: ධර්මය යනු නසීහත් නැමැති හොඳ උපදෙස් හා යහපත් චින්තනයයි(සිතුවිල්ලයි) එවිට සහාබාවරුන් (සහගාමිකයින්) අපි සියලු දෙනා යහපත් සිතුවිලි ඇති කළ යුත්තේ කවුරු වෙනුවෙන් දැයි විමසුවෙමු.ඒ ඇසූ එතුමාණෝ, අල්ලාහ්ටත් ඔහුගේ ධර්මයටත් ඔහුගේ දූතයාණන්ටත්,මුස්ලිම්වරුන්ගේ නායකයින්ටත් ඔවුන් යටතේ පාලනය වන ජනතාවටත්(යහපත්) සිතුවිලි ඇති කරගැනීම වේ යනුවෙන් ප්‍රකාශ කළහ.(මුස්ලිම්)

පාලකයා අධර්මිෂ්ඨ හා අයහපත් හේතුවෙන් ඔහුගේ පෞද්ගලික පාපයන් හා වැරදීන් ප්‍රසිද්ධ කිරීම හෝ ඔහු පිළිබඳ කේළම් කීම හෝ සුදුසු නොවේ.එමෙන්ම ඉස්ලාමීය විද්වතෙකු ජනයින් හට යහපතක් ගෙන දෙන ධාර්මික හෝ ලෞකික විෂයන් වලින් ඈත් වී නිහඬතාවයෙන් පසු වීම යහපත් නොවේ.ඔහුගේ නිහඬතාවය හා සන්සුන්කම තිබිය යුත්තේ සිය පෞද්ගලික කරුණු වලදී ය.ජනයින්ගේ යහපතක් කෙරෙහි නිහඬතාවයෙන් පසු වීම යනු ඔහුට අදාල නොමැති ගුණාංගයකි.පොදුවේ අසාධාරණයට ලක් වූ පුද්ගලයෙකු සඳහා හැකි නම් ස්වල්ප මුදල් ප්‍රමාණයක් හෝ ලබා දී ඔහුට උදවු කළ යුතුයි.එසේම කුසගින්නෙන් පසු වන පුද්ගලයෙකු සඳහා රට ඉඳි ගෙඩියක්

ලබා දි හෝ ඔහුගේ කුසගින්න නිවා දැමීමට උත්සහ කළ යුතුයි.එසේනම් විද්වතෙකු ජනයින්ගේ ලෞකික හා ධාර්මික අත්‍යාවශ්‍ය විෂයන් කෙරෙහි උන්නදුවෙන් සිටිය නොහැක්කේ කෙසේද යන්න වටහා ගත යුතු කරුණකි. ඔහුටද සමාජය යහමගෙහි යොමු කිරීම කෙරෙහි වගකීමක් ඇත.ජනයින්ගේ ලෞකික විෂයන් ප්‍රතිසංස්කරණය කිරීම යනු ඔවුන්ගේ ධාර්මික විෂයන්හි දියුණුවට රුකුලක් වේ .අති උත්තම නබි (සල්) තුමාණන් සතුව ලෝකයේ වටිනා වස්තූන් කෙරෙහි උනන්දුවක් නොතිබුණි.එනමුත් ජනයින් හා සම්බන්ධ අල්ප විෂයක් වුවද ඒ කෙරෙහි එතුමාගේ උනන්දුව කෙසේ වීද යන්න එතුමාගේ ඉතිහාසය තුළ දක්නට හැක.

# දහතුන්වන පාඩම

## ජිහාද් යන සංකල්පය ඉස්ලාම් දහම තුළ විශ්වයේ අවසන් දින දක්වා රැඳා පවතී.

අල්කුර්ආනය පවතින තාක්කල් ලොවෙන් කිසිදා එම නීතිය අවලංගු වන්නේ නැත.නබි(සල්) තුමාණන් මෙසේ වදාලහ:

මාගේ ජන සමූහයෙන් පිරිසක් අවසන් දින දක්වා සත්‍ය මත ප්‍රත්‍යක්ෂ ලෙස සිටිනු ඇත. (මූලාශ්‍රය: මුස්ලිම් වැකි අංක 156)

## ජිහාද් යන සංකල්පය කොටස් දෙකකි:

- සිය ආත්මය හා සම්බන්ධ විෂයන් ආරක්ෂා කිරීම සඳහා දියත් කරනු ලබන ජිහාදය. මෙම ජිහාදය සඳහා ඉස්ලාමීය රාජ්‍ය පාලකයෙකුගේ අවසරයක් අවශ්‍ය නැත. මෙහිදී සිය චේතනාව හා අරමුණ විය යුත්තේ තමන්ට සිදු වන හිංසාව මුලිනුපුටා දැමීමයි.මේ ආකාරයෙන් සිය ජීවිතය ,සිය දේපළ හා සිය ආත්මභාවය පැහැර හරිනු ලබන අන්දමින් සිදු වන බාධක වලින් තමාව ආරක්ෂා කිරීම මුස්ලිම්වරුයෙකු සඳහා අනිවාර්ය වේ.නබි (සල්) තුමාණන් මෙසේ අවධාරනය කර ඇත:

තම වස්තුව,තම ජීවිතය,තම ආගම හා තම පවුල රැකගැනීම වෙනුවෙන් ඝාතනයට ලක්වූ අය ෂහීද් (අල්ලාහ්ගේ මාර්ගයේ දිවි පිදූවන්) වනු ඇත.(මූලාශ්‍රය: බුහාරි 2348)

- සිය ජීවිතය, දේපළ හා සිය ආත්මභාවය පැහැර හරිනු ලබන අන්දමින් කටයුතු කරන සතුරෙකු මුස්ලිම් හෝ මුස්ලිම් නොවූ කෙනෙකු වූවත් ඒවා ඔහුගෙන් ආරක්ෂා කිරීම අනිවාර්ය වන අතර ඒ සඳහා සාධකයක් පහත සඳහන් නබි වදනෙහි සඳහන් වේ.

නබි (සල්) තුමා වෙත අයෙකු පැමිණ කවර හෝ කෙනෙකු මාගේ මුදල් පැහැර ගැනීමට පැමිණියේ නම් මා කුමක් කළ යුතුදැයි විමසා සිටීය.ඔහුට අල්ලාහ්ව (ඔහුගේ දඬුවම)මතක් කර දෙනු යනුවෙන් නබි(සල්)තුමා උත්තර දුන්හ.ඔහු එය පිළි නොගත් විට මා කුමක් කළ යුතුද යනුවෙන් එම පුද්ගලයා විමසීය.ඔහුට එරෙහිව අවට සිටින මුස්ලිම්වරුන්ගෙන් උදවු ඉල්ලනු මෙන් නබි(සල්) තුමා ප්‍රකාශ කළේය.මා අවට මුස්ලිම්වරුන් නොමැති නම් මා

කුමක් කළ යුතුද යනුවෙන් එම පුද්ගලයා විමසා සිටීය.ඔහුට එරෙහිව ඉස්ලාමීය රාජ්‍ය පාලකයාගෙන් උදවු ඉල්ලනු මෙන් නබි (සල්) තුමා ප්‍රකාශ කළේය.(ඉස්ලාමීය රාජ්‍ය) පාලකයා මාගෙන් ඈත්ව සිටියේ නම් මා කුමක් කළ යුතුද යනුවෙන් විමසීය .ඔබේ මුදල ආරක්ෂා කළ හැකි වන තෙක් හෝ ඔබ අල්ලාහ්ගේ මාර්ගයේ දිවි පුදන තෙක් ඔහු සමග සටන් වදිනු මෙන් නබි(සල්)තුමාණන් ප්‍රකාශ කළහ. (මූලාශ්‍රයඃ අන් නසාඉ 4081/ඉබ්නු අබී ෂයිබා 28043/ අහ්මද් 22514/ අත්තබරානී 20/313.)

- දෙවන කොටසඃ අල්ලාහ්ගේ ධර්මය ආරක්ෂා කිරීම සඳහා කරනු ලබන ජිහාදය.මෙම ජිහාදයේ අරමුණ විය යුත්තේ හුදෙක් අල්ලාහ්ගේ ධර්මය ආරක්ෂා කිරීම පමණි.ඒ සඳහා සාධකයක් පහත සඳහන් නබි වදනෙහි සඳහන් වේ.

  අරාබි ගැමියෙකු නබි (සල්) තුමා වෙත පැමිණ මෙසේ විමසීයඃ කෙනෙකු සටනින් ලබා ගත හැකි වස්තූන් සඳහා සටන් කරයි. තවත් කෙනෙකු ඔහු ප්‍රශංසාවට ලක් විය යුතුයි යන අරමුණින් සටන් කරයි. තවත් කෙනෙකු ඔහුගේ හැකියාව පෙන්නුම් කිරීම සඳහා සටන් කරයි. මොවුන්ගෙන් අල්ලාහ්ගේ මාර්ගයෙහි සටන් කළ පුද්ගලයා කවරෙකුද? අල්ලාහ්ගේ ධර්මය ආරක්ෂා කිරීම පිණිස සටන් කරන්නා අල්ලාහ්ගේ මාර්ගයේ සටන් කළ පුද්ගලයා වේ යනුවෙන් නබි(සල්)තුමාණන් ප්‍රකාශ කළහ. (මූලාශ්‍රයඃ බුහාරි වැකි අංක 2655/මුස්ලිම් වැකි අංක 1904)

ජිහාදයේ දෙවන වර්ගය වන අල්ලාහ්ගේ ධර්මය ආරක්ෂා කිරීම පිණිස සටන් කිරීමේ විෂයෙහි ඉස්ලාම් දහමට එරෙහි නොවන අන්දමින් පාලනය කරන ඉස්ලාමීය රාජ්‍ය පාලකයෙකුට අවනත විය යුතුයි .ඒ පිළිබඳව නබි(සල්) තුමාණන් මෙසේ සඳහන් කර ඇතඃ

කවරෙකු මට අවනත වන්නේද ඔහු අල්ලාහ්ට අවනත විය.කවරෙකු මට එරෙහිව කටයුතු කරන්නේද ඔහු අල්ලාහ්ට එරෙහිව කටයුතු කළේය. කවරෙකු මාගේ නායකයාට අවනත වන්නේද ඔහු මට අවනත විය.කවරෙකු මාගේ නායකයාට එරෙහිව කටයුතු කරන්නේද ඔහු මට එරෙහිව කටයුතු කළේය. (මූලාශ්‍රයඃ බුහාරි 6718/මුස්ලිම්/1835)

# දාහතරවන පාඩම

## මිනිසුන් අතුරින් ධර්ම දූතයින්ට පසු ඉතා ශ්‍රේෂ්ඨ උදවිය යනුවෙන් සලකනු ලබන්නේ නබි(සල්)තුමාගේ සහගාමීන් වන සහාබිවරුන් වේ.

එම ශ්‍රේෂ්ඨත්වය තහවුරු කරමින් පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ වාර්තා වේ:

මුහම්මද් අල්ලාහ්ගේ දූතයා ය. ඔහු සමඟ සිටින අය (ඒකම දෙවියන්) ප්‍රතික්ෂේප කරන අය කෙරෙහි දැඩි ව ද තමන් අතර දයාලු ව ද සිටිති. ඔවුහු රුකූ, සුජූද් කරන්නන් වශයෙන් ඔබ දකින්නෙහිය.ඔවුහු අල්ලාහ්ගෙන් දයාව ද තෘප්තිය ද පතති. (ෆත්හ්: 29)

ධර්ම දූතයින්ගේ මහිමයන් අතර ප්‍රභේද හා තරාතිරම් පවතිනවාක් මෙන් සහාබිවරුන්ගේ මහිමයන් අතරද ප්‍රභේද හා තරාතිරම් පවතී.ඒ අනුව ධර්ම දූතයින් අතුරින් අවම ශ්‍රේෂ්ඨත්වයක් හිමි වන ධර්ම දූතයා සහාබිවරුන් අතුරින් ශ්‍රේෂ්ඨමත් සහාබිවරයෙකුට වඩා උසස් ය. සහාබිවරුන් අතුරින් අඩුම ශ්‍රේෂ්ඨත්වයක් හිමි වන සහාබිරවරයා ඔවුනට පසු ආ තාබිඊන්වරුන් අතුරින් උසස් ශ්‍රේෂ්ඨත්වයක් හිමි වන තාබිඊවරයාට වඩා උසස් ය.

- සහාබිවරුන්ගෙන් වඩාත් විශිෂ්ඨ වන්නේ අස්සාබිකූනල් අව්වලූන් හෙවත් පෙරටුව ගිය ප්‍රමුඛයින් යැයි කියනු ලබන ඉස්ලාම් දහමෙහි ආරම්භක අසීරු කාල වකවානුවේදී ඉස්ලාම් දහමට ප්‍රවිෂ්ඨ වූ පිරිසයි. ඉස්ලාම් දහමට නිසි බලයක් හිමි වූ කාල වකවානුවේදී ඉස්ලාම් දහමට ප්‍රවිෂ්ඨ වූ පිරිසට වඩා ඔවුන් ඉතා විශිෂ්ඨයි.මෙම විශිෂ්ඨත්වය පෙන්වන සාධකයක් වශයෙන් අල් කුර්ආනයේ 57: 10 වැකියෙහි අල්ලාහ් මෙසේ අවධාරණය කරයි.

  නුඹලාගෙන් ජයග්‍රහණයට පෙර (යහපත් මාර්ගයේ) වියදම් කොට සටන් කළ අයට (නුඹලාගෙන් කිසිවෙක්) සමාන නොවෙති. (ජයග්‍රහණයට) පසු වියදම් කොට සටන් කරන අයට වඩා ඔවුහු ඉමහත් තනතුරු තිබෙන අය වෙති. (හදීද්: 10)

  සහාබිවරයා යන උසස් නාමය මක්කා ජයග්‍රහණයට පසු ඉස්ලාමය වැළඳ ගත්

උදව්ය සඳහාද උපයෝගී කරනු ලැබේ.මන්දයත් ඉහත සඳහන් අල්කුර්ආන් වැකියෙහි අවසානයේදී අල්ලාහ් මෙසේ සඳහන් කරයිඃ

සියල්ලන්ටම හොඳ ඵලවිපාක දෙන්නේ යැයි අල්ලාහ් පොරොන්දු දුන්නේය.නුඹලා කරන දෑ පිළිබඳ අල්ලාහ් ස්වඥානීය. (හදීද්ඃ 10)

තවද මෙසේ සඳහන් වේඃ

හිජ්රත් කළ අයගෙන් ද අන්සාරිවරුන්ගෙන් ද පෙරටුව ගිය ප්‍රමුඛයින් ගැන ද යහ කටයුතු වල ඔවුන් අනුගමනය කළාය ගැන ද අල්ලාහ් තෘප්තිමත් විය. ඔවුහු ද ඔහු ගැන තෘප්තිමත් වූහ. (තව්බාඃ 100)

- අස්සාබිකූනල් අව්වලූන් හෙවත් පෙරටුව ගිය ප්‍රමුඛයින් අතුරින් ස්වර්ගය සතු යැයි ශුභාරංචි ලැබූ දස දෙනා ඉතා විශිෂ්ඨයි. එම දස දෙනාගෙන් කුලෆාවරුන් සතර දෙනා ඉතා විශිෂ්ඨයි. ඉන් පසු බද්ර් සටනට සහභාගී වූ උදවීන් ඉතා විශිෂ්ඨයි.ඉන් පසු උහද් සටනට සහභාගී වූ උදවීන් ඉතා විශිෂ්ඨයි. ඉන්පසු හුදෛබිය්යා ගිවිසුම් අවස්ථාවේ ක්‍රියාත්මක වූ බයිඅත් අර් - රිල්වානයට සහභාගී වූ සහාබාවරුන් ඉතා විශිෂ්ඨයි. ඔවුන් එක්දහස් හාරසිය දෙනෙකු පමණ විය.මේ පිළිබඳ අල්කුර්ආනයේ සෘජු ප්‍රකාශයක් ද පැමිණ ඇතඃ

ඒ ගස යට සිට ඔබට ප්‍රතිඥා දුන් විට, අල්ලාහ් විශ්වාස කළ අය ගැන තෘප්තිමත් විය. ඔවුන්ගේ සිත්හි තිබෙන දැය ගැන ඔහු දනියි. ඔවුන් කෙරෙහි ශාන්තභාවය ඔහු පහල කළේය. ඔවුනට සමීපව තිබෙන ජයග්‍රහණයක් ද පිරිනැමීය. (ෆත්හ්ඃ 18)

ඒ පිළිබඳ නබි (සල්) තුමාණන් ප්‍රකාශ කළ බව මෙසේ වාර්තා වේඃ

ගස යට සිට ප්‍රතිඥා දුන් උදවීම් ලොවෙහි ඉතා විශිෂ්ඨතම උදවීන් වෙති. (මූලාශ්‍රයඃ බුහාරි වැකි අංක 4154/වාර්තාකරු ජාබිර් (රළි) තුමා)

සහාබිවරුන් යනු අල්ලාහ්ගේ වහී හෙවත් අල්කුර්ආනය හා නබි(සල්) තුමාගේ මග පෙන්වීම් උසුලා අප වෙත වාර්තා කළ උදවීන් වෙති.ඔවුන් පිළිබඳ ක්‍රෝධ හැඟීම් හා ඔවුනට අවලාද නැඟීම යනු ඉස්ලාම් දහමෙහි සම්බන්ධතාවය විසන්ධි කිරීම තවද නබි වදන් කෙරෙහි අවිනිශ්චිත භාවයෙන් පසු වීම හා සමාන වේ. නබි (සල්) තුමාණන්ට පසු එතුමාගේ ජන සමාජයේ රැකවරණය ඔවුන් වෙති. ඒ පිළිබඳ නබි(සල්)තුමාණන් මෙසේ අවධාරනය කර ඇතඃ

මාගේ සහගාමීන් මාගේ ජන සමාජය සඳහා රැකවරණයකි. මාගේ සහගාමීන්ට පසු

මාගේ ජන සමාජයට අණ කළ දෑ පැමිණෙනු ඇත. (සහීහ් මුස්ලිම් වැකි අංක 2531)

සහාබිවරුන් වැරද්දක් සිදු නොකරන සුරක්ෂිතභාවයෙන් පිදුම් ලත් උදවීන් නොවේ. එසේ තිබියදු ඔවුන් විසින් සිදු වූ වැරදි නිසාවෙන් ඔවුනට අවලාද නැගීම සුදුසු නැත.සහබාවරුන් අතර සිදු වූ ප්‍රශ්න පිළිබඳ වාද විවාද කිරීමෙන් නිහඬව සිටීම මුස්ලිම්වරුන් වන අපගේ යුතුකමකි. ඔවුන් විෂයෙහි ඉතා ගෞරවයෙන් යුතුව කටයුතු කළ යුතුයි. මන්දයත් සහාබිවරුන් යනු ඔවුනතර මතභේද සිදු වුනද මතභේද නොවී එකමුතුව සිටින උදවියට වඩා උසස් ය.මන්දයත් සර්වබලධාරී අල්ලාහ් එම උදවිය ගෞරවයට පත් කළේ උතුම් වූ නබි (සල්) තුමාගේ සමගාමිත්වය ලබා ගැනීමේ වරප්‍රසාදය ඔවුනට හිමි වූ නිසාවෙනි.ඔවුන් අතර සිදු වූ මෙම ගැටුම් සියල්ලෙහි පදනම වන්නේ ඉජ්තිහාද් හෙවත් කුසල් හිමි කර දෙන්නා වූ කාර්යක්ෂම ලෙසින් පර්යේෂණ කිරීම වේ.එම පර්යේෂණය වැරදි වූයේ නම් කාර්යක්ෂම ලෙසින් පර්යේෂණ කළ හේතුවෙන් ඔහුට කුසලක් හිමි වන අතර ඔහු විසින් සිදු වූ වරදට සමාව දෙනු ලබයි.

එනමුත් නබි (සල්) තුමා සමග ගැටුම් ඇති කිරීම යනු ඉමහත් අපරාධයකි. එම අපරාධය ඔවුනතර සිදු වීමෙන් අල්ලාහ් ඔවුන්ව ආරක්ෂා කළේය. අල්ලාහ් ඔවුන් සඳහා විශිෂ්ඨ ස්ථානයක් හිමි කර දීමේ හේතුවද එම සහාබිවරුන් නබි (සල්) තුමාණන් සමග යහපත් ලෙස කටයුතු කළ හේතුවෙනි. සහාබිවරුන් අතුරින් එක් අයෙකුට හෝ අවලාද නැගීමේ දොරටුව විවෘත කළේ නම් සහාබිවරුන් අතුරින් සෑම උදවියක් සඳහාම අවලාද නැගීමේ දොරටුව විවෘත වී යනු ඇත.එබැවින් ඒ පිළිබඳ තාබිඊන්වරුන් හා ඔවුනට පසු ආ පරම්පරාවද කතාබහට ලක් කිරීමෙන් වැළකී සිටියහ.උමර් බින් අබ්දුල් අසීස් (රහ්)තුමාණන්ගෙන් අලි හා උස්මාන්(රළි) තුමාණන් පිළිබඳව හා ජමල් හා සිෆ්ෆීන් වැනි සටන් පිළිබඳ විමසන ලදී. එවිට මෙය රුධිර හැළීමකි.ඉකුත් වී ගිය සුළු කරුණකි. එයින් අල්ලාහ් අපගේ අත් පිරිසිදු කොට ඇත. ඒ සම්බන්ධයෙන් අපි කතා නොකළ යුතුයි යනුවෙන් පවසා ඇත.

එමෙන්ම විනිශ්චය දිනයේ එම සහාබිවරුන් අතර සිදුවූ ගැටුම් පිළිබඳ ඔවුනට පසු ආ පරම්පරාවෙන් අසනු නොලබයි. අසනු ලබන්නේ එම සහාබිරවරුන්ගේ මහිමය තහවුරු කළාද යන්න වේ.

# පහළොස්වන පාඩම

## මුස්ලිම්වරුයෙකු කුෆ්ර් හෙවත් දේව ප්‍රතික්ෂේපය හා සම්බන්ධ පාපයන් හැර වෙනත් කුමන හෝ පාපයක් සිදු කිරීම තුලින් ඉස්ලාම් දහමෙන් බැහැර කරනු නොලබයි.

*කුෆ්ර් හෙවත් දේව ප්‍රතික්ෂේපය හා සම්බන්ධ පාපයන් අතුරින් ස්වල්පයක් පහත දැක්වේ.*

*අල්ලාහ්ට අවලාද නැගීම:*

*ඔහුට අවලාද නැගීම යනු ඔහුට අදේශ කිරීමට වඩා ඉමහත් පාපයකි. මන්දයත් අල්ලාහ්ට ආදේශ කරන උදවීන් විසින් කිසිදා තමන් වන්දනාමාන කරන එම ගලට හිමි පහත් තත්වය අල්ලාහ්ට ලබා දුන්නේ නැති අතර ඔවුන් විසින් සිදු කරනු ලබන්නේ අල්ලාහ්ට හිමි ස්ථානය සමග ගල සම කිරීමයි.ඒ පිළිබඳ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:*

*නුඹලා විශ්වයේ දෙවියන්ට සමාන කළ විට, අල්ලාහ් මත දිවුරමු , අපි පැහැදිලි දුර් මාර්ගයක සිටියෙමු'යි ඔවුන් එකිනෙකා එහි වාද කරමින් පවසති.(ෂුඅරා: 97/98)*

*අල්ලාහ්ට ආදේශ කළද ඔවුහු අල්ලාහ්ව පහත් කොට නොසැලකූ බව මෙම අල්කුර්ආන් වැකියෙන් පැහැදිලි වේ.එනමුත් කවරෙකු අල්ලාහ්ට අවලාද නගන්නේද ඔවු එම ගලට හිමි තත්වයට වඩා පහත් තත්වයක් අල්ලාහ්ට හිමි කර දෙන හේතුවෙන් එය ආදේශ කිරීමට වඩා ඉමහත් පාපයක් වනු ඇත.*

*තවද අල්ලාහ්ට අවලාද නැගීම යනු ඉමහත් දේව ප්‍රතික්ෂේපයකි.කුෆ්ර් හෙවත් දේව ප්‍රතික්ෂේපයෙහි තරාතිරම් ඇත. ඊමාන් හෙවත් දේව විශ්වාසයෙහි අඩු වැඩි වීමක් සිදු වනවාක් මෙන් දේව ප්‍රතික්ෂේපයෙහිද තරාතිරම් ඇත. ඒ බව පැහැදිලි කරන අල්කුර්ආන් වැකි පහත සඳහන් වේ:*

1) මසක පුණපත්වය (කල් දැමීම) දේව ප්‍රතික්ෂේපය වැඩි කරවන්නකි. (තව්බා: 37)

2) විශ්වාසය කළ පසු ප්‍රතික්ෂේප කොට ඉන් පසු (දේව) ප්‍රතික්ෂේපය වැඩි කර ගත් අයගේ පාප ක්ෂමාව කිසි විටෙක භාර ගනු නොලැබේ.මග වරදවා ගත් අය ඔවුහු ම ය .(ආලුඉම්රාන්: 90)

මේ ආකාරයෙන් දේව ප්‍රතික්ෂේපයේ අඩු වැඩි වීමක් සිදු වීම තුලින් කිසිදා නරකාදියෙන් එම උදවීන් බැහැර වන්නේ නැත. එසේනම් එයින් අදහස් වන්නේ නරකාදියේ වේදනාවන්හි හා දඬුවම්හි වර්ධනයක් හෝ ලිහිල්භාවයක් සිදු වනු ඇත යන්න පමණි.ඒ බව පහත සඳහන් අල්කුර්ආන් වැකි පැහැදිලි කරයි:

(අප) ප්‍රතික්ෂේප කොට අල්ලාහ්ගේ මාර්ගයෙන් (මිනිසුන්) වැළැක්වූ අයට ඔවුන් අවුල් ඇති කරමින් සිටි බැවින් අපි ඔවුනට වේදනාවට ඉහළින් වේදනාවක් වැඩි කරන්නෙමු.(නහ්ල්: 88)

අල්ලාහ් හා ඔහුගේ ධර්ම දූතයාණන් ස්වර්ගය සතු යැයි සුභාරංචි දැන් වූ අයවලුන් හැර නිශ්චිත ලෙස කෙනකු ස්වර්ගයට පිවිසේද නැතහොත් නරකාදියට පිවිසේද යන්න පිළිබඳ අපට කිව නොහැක. එනමුත් කවරෙකු අල්ලාහ්ව විශ්වාස කරමින් මියදෙන්නේද ඔහු ස්වර්ගයට අයත් අයෙකු හා කවරෙකු අල්ලාහ්ව ප්‍රතික්ෂේප කර මියදෙන්නේද ඔහු නරකාදියට අයත් අයෙකු බව පොදුවේ විශ්වාස කරනු ලැබේ.

# දහසයවන පාඩම

## සැබෑ නිදහස යන සංකල්පය මඟින් අදහස් කරනු ලබන්නේ සර්ව බලධාරී අල්ලාහ් හැර අන් සියලු වස්තූන් ඉදිරියේ වහලෙකු ලෙස යටහත් පහත්ව ජීවත් වීමෙන් වැළකී සිටීම වේ.

*එසේ නොමැතිව සැබෑ නිදහස යනු අල්ලාහ්ගේ ආධිපත්‍යයෙන් හා නීතියෙන් බැහැර වීම යනුවෙන් හැඳින්වීම සිය ආත්මය හා චිත්තාභිලාශයන් දෙවියෙක් බවට ගැනීම හා සමාන වේ. පාරිශුද්ධ අල්කුර්ආනයේ අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:*

*තම චිත්තාභිලාෂය තම දෙවියන් කර ගත් කෙනෙකු ඔබ දුටුවෙහි ද? අල්ලාහ් දැනුවත්ව ම ඔහු නොමග යැවීය. ඔහුගේ ශ්‍රවණයෙහි ද සිත්හි ද මුද්‍රා තැබීය .ඔහුගේ දෘෂ්ටිය මත තිරයක් ඇති කළේය. අල්ලාහ්ට පසු ඔහුට මග පෙන්වන්නා කවරෙක් ද? නුඹලා නොසිතන්නෙහු ද? (ජාසියාහ්: 23)*

*කවරෙකු හෝ තමාගේ අභිමතයට අනුව සියල්ලක් කළ හැකි යැයි තමා විසින්ම අනුමත කර ඒ අනුව ක්‍රියා කරන්නේ නම්, තම චිත්තාභිලාෂයන්ට හා ෂෙයිතාන්ට ඔහු යටහත් පහත් වන බව එමගින් තහවුරු කරයි.මන්දයත් පොදුවේ මිනිසා මවන ලද්දේ වහලෙකු ලෙසිනි. ඔහු අල්ලාහ්ට වන්දනාමාන කර එම වහල්භාවය ඔහුට පමණක් සීමා නොකළේ නම් නිසැකව අල්ලාහ් හැර අන් අයෙකුට ඔහු වහලෙකු වනු ඇත.*

*ලෝකයේ එක් මිනිසෙකු පමණක් සිටියේ නම් ඔහු සඳහා දුරාචාරය , කෙනෙකු ඝාතනය කිරීම් වැනි පාපයන් සඳහා දඬුවම් නියම කිරීමට අල්ලාහ්ට අවශ්‍ය නැති අතර පොලිය වැනි දෑ තහනම් කිරීමටද අවශ්‍ය වන්නේ නැත.අල්ලාහ් මෙවැනි නීතීන් සියල්ල නියම කර ඇත්තේ ඔහු සමඟ අන් අයත් සාමූහිකව ජීවත් වන හෙයිනි.එක් පුද්ගලයෙකු වෙනුවෙන් එවැනි නිති පද්ධතියක් අවශ්‍ය වන්නේ නැත.ඔහුත් සමඟ ජනයින් වර්ධනය වීම මඟින් සාමූහික ජීවන සැලැස්මක් නිර්මාණය වනු ඇත. උදාහරණයක් ලෙස ගත් කළ විශ්වයේ සඳ පිහිටා ඇත්තේ ඉර ,තාරුකාවන් හා ග්‍රහලෝක සමඟම නියමාකාරව කක්ෂයෙහි භ්‍රමනය වීම සඳහාය. තාරුකාවන් හා ග්‍රහලෝක නොමැතිව සඳ පමණක්*

තිබුණේ නම් වර්තමානයේ පවතින අයුරින් නිසි ප්‍රයෝජනයක් එයින් සිදු නොවෙනු ඇත.එම සඳ නිසි අයුරින් භ්‍රමනය වන්නේ ඉර ,තාරුකාවන් හා ග්‍රහලෝක සමඟම සාමූහිකව කක්ෂයෙහි භ්‍රමනය වීමෙනි.පාරිශුද්ධ අල්කුර්ආනයේ අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයිඃ

ඔහු රාත්‍රිය දවාලෙන් ආවරණය කරයි. දහවල , රාත්‍රිය පසු පස වේගයෙන් හඹා යයි.ඔහු සූර්යයා ද චන්ද්‍රයා ද තාරකා ද තම නියෝගයෙන් අවනත කරවීය.දැන ගන්න ! නිර්මාණය ද නියෝගය ද ඔහුට ම හිමිය.විශ්වයේ දෙවියන් වන අල්ලාහ් භාග්‍යවන්තයෙකි. (අඃරාෆ්ඃ 54)

තවද මෙසේ ප්‍රකාශ කරයිඃ

සූර්යයා විසින් චන්ද්‍රයාට ළඟා විය නොහැකිය. රාත්‍රිය දහවල ඉක්මවන්නේ ද නැත. සියල්ල කක්ෂයෙහි පාවෙයි. (යාසීන්ඃ 40)

ඉස්ලාම් දහමෙහි නීතී රීතීන් පහළ වූයේ ලෞකික හා ධාර්මික විෂයන් අතර තිබෙන සම්බන්ධතාවය තහවුරු කිරීම පිණිසයි. ඒ අනුව කවරෙකු අල්ලාහ් නියම කළ නීතීන් බැහැර කිරීමට තැත් කරන්නේද ඔහු අල්ලාහ්ගේ දඬුවම ට සුදුසු වනු ඇත.ඉස්ලාම් දහමට ප්‍රවිෂ්ඨ වීම අනිවාර්ය කරුණකි.ඉස්ලාම් දහමෙන් බැහැර යාම දේව ප්‍රතික්ෂේප-යකි. පාරිශුද්ධ අල්කුර්ආනයේ අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයිඃ

නුඹලාගෙන් යම් කෙනෙක් තම ධර්මයෙන් හැරී(එකම දෙවියන්) ප්‍රතික්ෂේප කරන්නෙකු ලෙස මරණයට පත් වූයේ නම් එවැන්නන්ගේ ක්‍රියා මෙලොවදීත් පරලොවෙදීත් නිෂ්ඵල වනු ඇත. ඔවුහු නිරාවාසිහු ය. ඔවුහු එහි සදාකාලීනව සිටිති. (අල්බකරාඃ 217)

විශ්වයේ තිබෙන නිර්මාණයන් සියල්ලෙහිම අරමුණ වන්නේ අල්ලාහ්ට පමණක් වහල්භාවය තහවුරු කිරීමයි. ඒ අනුව කවරෙකු හෝ එම සංකල්පය අවිශ්වාස කර එම සංකල්පයෙන් බැහැර යෑමට තැත් කළේ නම් එමඟින් ඔහුගේ අභ්‍යන්තර සිතෙහි එකී අරමුණ පිළිබඳ දුර්වල ස්ථාවරයක් තිබෙන බව හෝ එම සංකල්පය පිළබඳ පූර්ණ විශ්වාසයක් නොමැති බව තහවුරු කරයි. එනමුත් උත්තරීතර අල්ලාහ් ලෝකයේ මිනිසා මැවීමට හේතුව මේ අකාරයෙන් පැහැදිලි කරයිඃ

ජින්වරුන් හා මිනිසුන් මා නැමදුම් කරන්නට මිස(අන් කිසිවකට) මම නිර්මාණය නොකළෙමි. (දාරියාත්ඃ 56)

ඒ අනුව කවරෙකු ලෝකයේ මිනිසුන් හා ජින්වරුන්ව නැමදුම් කිරීම සඳහා නිර්මාණය

කළේද ,විනිශ්චය දිනයේදී ඔවුන් විනිශ්චය කර කුලිය හෝ දඬුවම ලබා දීම සඳහා නැවත වරක් ඔවුන්ව නැගිටු වනු ඇත.

සර්ව බලධාරී අල්ලාහ් මෙලොවෙහි හා එලොවෙහි අප සැමගේ ස්ථාවරයන් සියල්ල නිවැරදි කර දෙන්වා !

ආමීන්

නබි (සල්) තුමාණන් හට හා ඔහුගේ අනුගාමිකයින් හට අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය අත් වේවා.

IslamHouse.com

@IslamHousesi islamhousesi islamhouse.com/si/

IslamHouse-153825271615795 channel/UCIkxdDcIBpRBNSqaykgwhmQ

For more details visit
www.GuideToIslam.com

GUIDE TO ISLAM

contact us :Books@guidetoislam.com

Guidetolslam.org Guidetoislam1 Guidetoislam www.Guidetoislam.com


المكتب التعاوني للدعوة وتوعية الجاليات بالربوة


هاتف : ٩٦٦١١٤٤٥٤٩٠٠+ فاكس : ٩٦٦١١٤٩٧٠١٢٦+ ص ب : ٢٩٤٦٥ الرياض : ١١٤٥٧

ISLAMIC PROPAGATION OFFICE IN RABWAH

P.O.BOX 29465 RIYADH 11457 TEL: +966 11 4454900 FAX: +966 11 4970126

# ඉස්ලාමීය ප්‍රතිපත්ති
## පිළිබඳ ප්‍රධාන පාඩම්

ඉස්ලාම් දහමෙහි මූලික හා එහි ශාඛා ඉගැන්වීම් රාශියක ව්‍යාකූලත්වයක් ව්‍යාප්ත වූ හේතුවෙන් ඉස්ලාම් දහමෙහි සැබෑ මුහුණුවර ලොවට හෙළිදරව් කිරීම පිණිස ඉස්ලාම්හි මූලාශ්‍ර වන අල්කුර්ආනය හා නබි මුහම්මද් තුමාණන්ගේ ජීවන ආදර්ශයන් ඇතුලත් කරමින් කතෘ විසින් සංෂිප්ත මෙම කෘතිය ගොණු කර ඇත.





IslamHouse.com
Osoul Center
www.osoulcenter.com